වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT

# 2018

# ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
# ஊவா வெல்லஸ்ஸ பல்கலைக்கழகம்
# UVA WELLASSA UNIVERSITY



අගය එක් කිරීම සඳහා වූ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය
பெறுமதி சேர்த்தலுக்கான உன்னத மையம்
The Centre of Excellence for Value Addition

# වාර්ෂික වාර්තාව 2018
# ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

පස්සර පාර, බදුල්ල 9000

ශ්‍රී ලංකා

## දැක්ම

ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීම සඳහා වූ

විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය බවට පත්වීම

## මෙහෙවර

ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීම

කෙරෙහි ශක්තිමත් අවධාරණයක් සහිතව

ඉගැන්වීමෙහි, ඉගෙනීමෙහි හා පර්යේෂණයෙහි

උත්කෘෂ්ඨත්වයට පත් වන අතරම, ජාතික

සංවර්ධනයට සුවිශේෂී දායකත්වයන් ලබා දීම

පිණිස දැනුමෙන්, කුසලතාවලින්, සාරධර්මවලින්

හා ආකල්පයන් ගෙන් හෙබි බහුශ්‍රැත, රැකියා

නියුක්ත කළ හැකි, තාක්ෂණතාන්ත්‍රික හා

ව්‍යවසායික උපාධිධාරීන් බිහි කිරීම

# උපකුලපතිතුමාගේ පණිවිඩය



*ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීම සඳහා වූ විශිෂ්ටයත්වයේ කේන්ද්‍රයක් වනු පිණිස වූ දැක්මක් ද සහිතව් 2005ජූනි මාසයේදී ස්ථාපිත කරන ලදී.*

*ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සියලූම අධ්‍යයන වැඩ සටහන් මෙරට තිරසාර සංවර්ධනය උදෙසා සුවිශේෂි දායකත්වයක් ලබා දීමට අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප සහිත, සෑම අතින්ම පරිපූර්ණ, රැකියාවේ යෙදවිය හැකි උපාධිධාරීන් බිහි කරනු පිණිස ඉලක්ක වී ඇත. ව්‍යවසායක විශ්වවිද්‍යාලයකී වශයෙන් අපි අපගේ උපාධිධාරීන් රැකියා සොයන්නන් ලෙසට වඩා රැකියා සපයන්නන් ලෙස කටයුතු කරනු දකිනු කැමැත්තෙමු.*

*බදුල්ල මනරම් කඳුකර ප්‍රදේශයේ මනස්කාන්ත ලෙස පැතිරුනු දර්ශන සහිත භූමියක ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිහටා ඇති අතර, අක්කර 64 ක භූමි භාගයක් සිසාරා පැතිර ඇත්තේය. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පීඨ 4 කින් සමන්විත වන අතර එය දේශීය හා ගෝලීය අවශ්‍යතාවන් ඉටු කරන මූලකී උපාධි වැඩසටහන් 13 ක් ඉදිරිපත් කරයි.*

*අපි අපව,ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා කාර්යය මණ්ඩලය,ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයීය පවුල ලෙස සලකන්නෙමු. ගරු කිරීම හා ඉවසීම, අභිමතාර්ථ දිශාභිමුඛ වීම, සමාන ඉඩප්‍රස්ථා, විනය හා ව්‍යවසායකත්වය අප පවුලේ කේන්ද්‍රීය සාරධර්ම වන්නේය.*

*ගෙවුනු කෙටි කාල පරිච්ඡේදය තුළ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල උපාධිධාරීන් සුවිශේෂී ගුණාත්මක තත්ත්වයක සිටින බව සනාථ කර ඇති අතර,අප උපාධිධාරීන්ගේ ඉහළ රැකියා නියුක්තිය ඒ සඳහා ඇති පැහැදිලිම සාක්ෂ්‍යය වන්නේය.*

*ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සියලූ දෙනාගේ ගෞරවාදරයට පාත්‍ර වන විශිෂ්ටත්වයේ කේන්ද්‍රයක් වනු ඇති අතර, එය සේව්‍යයින්ට ප්‍රසාද ජනක වන සේවකයින් වනු පමණක් නොව, තමන්ද සේව්‍යයින් බවට පත් වන උපාධිධාරීන් බිහි කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත්තේය.*

***මහාචාර්ය ජයන්ත ලාල් රත්නසේකර***

# පටුන


දැක්ම

මෙහෙවර

උපකුලපතිතුමාගේ පණිවිඩය

විශ්වවිද්‍යාල පාලනය 01

I පාලක සභාව................................................................ 01

II සනාථන සභාව........................................................... 02

III ආයතනික ව්‍යුහය......................................................... 03

**1. උපකුලපතිතුමාගේ සමාලෝචනය........................................................ 04**

1.1 කෙටි හැඳින්වීම......................................................... 04

1.1.1 ශිෂ්‍ය ප්‍රජාව පිළිබඳ විස්තර............................................. 04

1.1.2 අධ්‍යයන පරිපාලන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල පිළිබඳ සමස්ත සටහන............................................................ 06

1.1.3 මූල්‍ය විශේෂතා......................................................... 06

1.2 සාධනතා .................................................................... 07

1.2.1 යටිතල පහසුකම්........................................................ 07

1.2.2 අධ්‍යයන හා පර්යේෂණ සාධනතා..................................... 07

1.2.3 ශිෂ්‍ය සාධනතා........................................................... 09

1.2.4 විදේශ සංචාර හා ජාත්‍යන්තර සහයෝගීතා.......................... 10

1.2.5 සහතික පත්‍ර මට්ටමේ වැඩසටහන්..................................... 12

1.2.6 පුස්තකාලය ............................................................... 12

1.2.7 සාම්ප්‍රදායික හා සංසකෘතික ඉසව්..................................... 13

1.2.8 ප්‍රජා බැහැර අවතීර්ණ වැඩසටහන්..................................... 15

1.2.9 ක්‍රීඩා ක්‍රියාකාරකම් ........................................................ 17

1.3 අනාගත සැලසුම්......................................................... 19

| | | | |
|---|---|---|---|
| **2.** | | **ශිෂ්‍ය ශිෂ්‍යාවෝ සහ සම්පත්..............................................** | 21 |
| | 2.1 | ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා මානව සම්පත් පිළිබඳ සාරාංශය................ | 21 |
| | 2.2 | ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීම........................................... | 21 |
| | 2.3 | ප්‍රථම උපාධි වැඩසටහන් වල නව ශිෂ්‍ය ඇතුළත්වීම් ................ | 22 |
| | 2.4 | උපාධිධාරී ප්‍රතිදානය...................................................... | 24 |
| | 2.5 | නේවාසිකාගාර............................................................. | 25 |
| | 2.6 | ශිෂ්‍යත්ව ..................................................................... | 28 |
| **3.** | | **මානව සම්පත්................................................................** | **30** |
| | 3.1 | අධ්‍යයන කාර්යය මණ්ඩලය........................................... | 30 |
| | 3.2 | පරිපාලන කාර්යය මණ්ඩලය ........................................... | 30 |
| | 3.3 | පුස්තකාල කාර්යය මණ්ඩලය.......................................... | 31 |
| | 3.4 | අධ්‍යයන උපකාරක කාර්යය මණ්ඩලය............................... | 31 |
| | 3.5 | අනධ්‍යන කාර්යය මණ්ඩලය............................................ | 31 |
| | 3.6 | අනධ්‍යන කාර්යය මණ්ඩල ව්‍යාප්තිය................................. | 32 |
| **4.** | | **පර්යේෂණය හා සංවර්ධනය ..............................................** | **34** |
| | 4.1 | පර්යේෂණ, නව්‍යකරණ හා ප්‍රකාශන................................. | 34 |
| | 4.2 | වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු................................ | 34 |
| | 4.3 | ලැබූ සම්මාන පිළිබඳ විස්තර............................................ | 34 |
| **5.** | | **ප්‍රාග්ධන කටයුතු ..........................................................** | **39** |
| | 5.1 | ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති හා ප්‍රගතිය පිළිබඳ විස්තර................ | 40 |
| | 5.2 | පුනරුත්ථාපන ව්‍යාපෘති පිළිබඳ විස්තර............................... | 42 |
| **6.** | | **මූල්‍ය ප්‍රකාශ..................................................................** | **45** |
| | | ගණන්දීමේ නිලධාරීගේ සහතිකය.................................... | 45 |
| | 6.1 | මූල්‍ය ප්‍රතිඵල පිළීබඳ සාරාංශය........................................ | 46 |

| | | | |
|---|---|---|---|
| | 6.1.1 | පුනරාවර්ථන වියදම්...................................................... | 46 |
| | 6.1.2 | ප්‍රාග්ධන වියදම්............................................................ | 47 |
| 6.2 | | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.................................................... | 49 |
| 6.3 | | මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය.............................. | 51 |
| 6.4 | | මුදල් ප්‍රවාහ ප්‍රකාශය....................................................... | 52 |
| 6.5 | | ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය................................... | 53 |
| 6.6 | | ගිණුම්කරණ ප්‍රතිපත්ති.................................................... | 55 |
| 6.7 | | මූල්‍ය ප්‍රකාශන සටහන්.................................................... | 57 |
| 6.8 | | පුනරාවර්තන වියදම් අනුව වැඩසටහන් සහ ව්‍යාපෘති වල සාරාංශය..................................................................... | 67 |
| 6.9 | | විගණකාධිපති වාර්තාව.................................................. | 69 |
| 6.10 | | විගණකාධිපති වාර්තාව තුළ මතු කරන ලද කාරණා සඳහා පිළිතුරු ...................................................................... | 81 |
| **7.** | | **තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම** | 99 |

## විශ්වවිද්‍යාලීය තන්ත්‍රණය

### I. පාලක සභාව

1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 24 වගන්තිය මගින් සංශෝධිත 1987 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 44 වගන්තිය ප්‍රකාරව සංස්ථාපනය කරන ලද විශ්වවිද්‍යාලීය පාලක සභාව 2018 වර්ෂයේදී පහත සාමාජිකයින් ගෙන් සමන්විත විය.

| නම | තනතුර | පත්කරන ලද දිනය |
|---|---|---|
| මහාචාර්ය ජේ.එල්. රත්නසේකර | උපකුලපති | නිල බලයෙන් පත්වන සාමාජිකයෝ |
| මහාචාර්ය එස්.සී.ජයමාන්න | පීඨාධිපති /සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම | |
| මහාචාර්ය ඊ.පී.එස්.කේ. එදිරිවීර | පීඨාධිපති / විද්‍යා හා තාක්ෂණවේද | |
| මහාචාර්ය කේ.බී. විජේසේකර | පීඨාධිපති /තාක්ෂණවේද අධ්‍යයන | |
| ජී.එච්. අබේවීර මහතා | පීඨාධිපති / කළමනාකරණ | |
| මහාචාර්ය ඩී.කේ.ඩී.ඩී. ජයසේන | සනාතන සභා නියෝජිත | 2017 ජූනි 23 |
| ආචාර්ය එච්.එම්.ජේ.සී. පිටවල | සනාතන සභා නියෝජිත | 2017 දෙසැම්බර් 22 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලද සාමාජික සාමාජිකාවෝ | | |
| ඩබ්ලියු. ප්‍රේමදාස මහතා | විශ්‍රාම ලත් දිස්ත්‍රික් ලේකම් | 2018 මැයි 18 දින |
| තිස්ස නන්දසේන මහතා | හිටපු ලේකම් /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 2018 මැයි 18 දින |
| මහාචාර්ය කේ.ඒ.පී. සිද්ධිසේන | සම්මාන මහාචාර්ය /කොළඹ විශ්වවිද්‍යාලය | 2018 මැයි 18 දින |
| මහාචාර්ය කල්‍යාණි පෙරේරා | සම්මාන මහාචාර්ය /පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 2018 මැයි 18 දින |
| මහාචාර්ය කේ. ගල්කැටිය | විශේෂඥ උපදේශක ශල්‍යවෛද්‍ය / ශික්ෂණ රෝහල, පේරාදෙණිය | 2018 මැයි 18 දින |
| වෛද්‍ය අසේල ගුණරත්න | අධ්‍යක්ෂ / ශික්ෂණ රෝහල, කළුබෝවිල | 2018 මැයි 18 දින |
| ජී.ආර්. ඕවිටිගල මහතා | ජ්‍යෙෂ්ඨ කළමනාකාර | 2018 මැයි 18 දින |
| එම්.එෆ්. හිබාතුල් කරීම් | ලේඛකාධිකාරී / පාලක සභාවේ ලේකම් | |

## II. සනාතන සභාව

1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 46 වගන්තිය ප්‍රකාරව සංස්ථාපනය කරනු ලබන ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සනාතන සභාව 2018 වර්ෂයේදී පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය:-

| | |
|---|---|
| මහාචාර්ය ජේ.එල්. රත්නසේකර | උපකුලපතිතුමා (සභාපති) |
| පීඨාධිපතිවරු | |
| මහාචාර්ය එස්.සී.ජයමාන්න | සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම |
| මහාචාර්ය ඊ.පී.එස්.කේ. එදිරිවීර | විද්‍යා හා තාක්ෂණවේද |
| ජී.එච්. අබේවීර මහතා | කළමනාකරණ |
| මහාචාර්ය කේ.බී. විජේසේකර | /තාක්ෂණවේද අධ්‍යයන |
| අධ්‍යයනාංශ ප්‍රධානීහු | |
| එන්.පී.පී. ලියනගේ මහතා | සත්ව විද්‍යා |
| ආචාර්ය පී.ඊ. කාලියාදාස | අපනයන කෘෂිකර්ම |
| ආචාර්ය එච්.එම්.ජේ.සී. පිටවල | විද්‍යා හා තාක්ෂණවේද |
| ආචාර්ය එම්.එම්.එස්.එන්. ප්‍රේමතිලක | පරිගණක විද්‍යා හා තාක්ෂණවේද |
| ආචාර්ය ජෙ.පී.ආර්.සී. රණසිංහ | කළමනාකරණ විද්‍යා |
| ආචාර්ය පී.එච්.ටී. කුමාර | රාජ්‍ය පරිපාලන |
| ජේ.එම්.පී.වී.කේ. ජයසුන්දර මිය (2018.12.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි) | ඉංග්‍රීසි භාෂා ශික්ෂණ |
| ආචාර්ය කේ.ජී.සී. සේනාරත්න | ජෛවපද්ධති තාක්ෂණවේදය |
| ආචාර්ය වයි.එන්.එස්. විජේවර්ධන | ඉංජිනේරු තාක්ෂණවේදය |
| මහාචාර්යවරු | |
| මහාචාර්ය ඩී.කේ.ඩී.ඩී. ජයසේන | සත්ව විද්‍යා අධ්‍යයනාංශය |
| මහාචාර්ය එච්.එම්.එස්.කේ. හේරත් එ.එ.එ.එ. | අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශය |
| මහාචාර්ය පී.එම්. සිරිමාන්න | විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශය |
| පීඨ නියෝජිතවරු | |
| ආචාර්ය ඊ.ඩී.එන්.එස්. අබේරත්න | සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය |
| ආචාර්ය ඒ.එම්.ඩබ්ලියු.කේ. සෙනෙවිරත්න | |
| ආචාර්ය එන්.පී. ප්‍රේමචන්ද්‍ර | විද්‍යා හා තාක්ෂණවේද පීඨය |
| ආචාර්ය කේ.ඩබ්.එස්.එන්. කුමාරි | |
| ආචාර්ය එච්.එම්.ඩබ්ලියු.එම්. හේරත් | කළමනාකරණ පීඨය |
| ආචාර්ය ජේ. සුතා | |
| ඩබ්ලියු.ඒ.ජේ. අනුරංගි මිය | තාක්ෂණවේද අධ්‍යයන |
| ජේ.එම්.එන්. ජයවීර මිය | |
| ඒ.එස්. සිරිවර්ධන මහත්මිය | පුස්තකාලයාධිපතිනි (සජ්ත-වාර්ෂික ස්ථානගතව) |
| එම්.එෆ්. හිබතුල් කරීම් මහතා | ලේඛකාධිකාරී - සනාතන සභාවේ ලේකම්) |

## III. සංවිධාන ව්‍යුහය




**AB-** සහකාර මූල්‍යාධිකාරී
**AR-** සහකාර ලේඛකාධිකාරී
**CSO-**ප්‍රධාන ආරක්ෂක නිලධාරී
**PE-** ශාරීරික අධ්‍යාපන
**DR-** නියෝජ්‍ය ලේඛකාධිකාරී
**DB-**නියෝජ්‍ය මූල්‍යාධිකාරී
**FB-** පීඨ මණ්ඩලය
**HOD-** අධ්‍යයනාංශ ප්‍රධානී
**SAB-**ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
**SAIA-**ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක
**SAR-** ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
**UMO-**විශ්වවිද්‍යාලීය වෛද්‍ය නිලධාරී



Uva Wellassa
University

# 1. උප කුලපතිතුමාගේ සමාලෝචනය

## 1.1. කෙටි හැඳින්වීම

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ජාතික සම්පත් සමුදායට අගය එකතු කිරීමේ තේමාව කරලියට ගෙනෙමින් පැහැදිලි දැක්මකින් යුතුව මෙරට 14 වැනි ජාතික විශ්වවිද්‍යාලය වශයෙන් ස්ථාපිත කරන ලදී.ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය බදුල්ල ප්‍රදේශයේ මනස්කාන්ත ලෙස පැතිරුනු දර්ශන සහිත මනරම් කඳුකර භූමියක පිහිටා ඇති අතර, අක්කර **64** ක භූමිභාගයක් සිසාරා පැතිර ඇත.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පීඨ **4** කින් සමන්විත වන අතර එය දේශීය හා ගෝලීය අවශ්‍යතාවන් ඉටු කරන ප්‍රථම උපාධි වැඩසටහන් **13** ක් ඉදිරිපත් කරයි.සියලු උපාධි වැඩසටහන් බහුවිෂයයික වන අතර ව්‍යවසායික අධ්‍යාපනය මත සංකේන්ද්‍රණය වී ඇත.

| පීඨය | උපාධි වැඩසටහන් |
|---|---|
| සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම | සත්ව විද්‍යාව පිළිබඳ බී.ඒ.එස්. ගෞරව උපාධිය<br>අපනයන කෘෂිකර්මය පිළිබඳ බී.එස්.සී. ගෞරව උපාධිය<br>තේ තාක්ෂණවේදය හා අගය එකතු කිරීම පිළිබඳ බී.එස්.සී. ගෞරව උපාධිය<br>ජලජ සම්පත් තාක්ෂණවේදය පිළිබඳ බී.එස්.සී. ගෞරව උපාධිය<br>තාලවෘක්ෂ හා ක්ෂීර තාක්ෂණවේදය පිළිබඳ බී.එස්.සී. ගෞරව උපාධිය |
| විද්‍යා හා තාක්ෂණවේද | විද්‍යාව හා තාක්ෂණවේදය පිළිබඳ බී.ටෙක් (විශේෂ) උපාධිය<br>කර්මාන්ත තොරතුරු තාක්ෂණවේදය පිළිබඳ බී.අයි.අයි.ටෙක්. (විශේෂ) උපාධිය<br>පරිගණක විද්‍යාව හා තාක්ෂණවේදය පිළිබඳ බී.එස්.සී. (විශේෂ) උපාධිය<br>ඛනිජ සම්පත් හා තාක්ෂණවේදය පිළිබඳ බී.එස්.සී. (විශේෂ) උපාධිය |
| කළමනාකරණ | ව්‍යවසායකත්වය හා කළමනාකරණය පිළිබඳ බී.බී.එම්. උපාධිය<br>සත්කාරකත්වය, සංචරණය හා උත්සව කළමනාකරණය පිළිබඳ බී.බී.එම්. උපාධිය |
| තාක්ෂණවේදීය අධ්‍යයනය | බී.ඊ.ටෙක්. උපාධිය<br>ජෛව පද්ධති තාක්ෂණවේදය පිළිබඳ බී.බී.ටෙක්. උපාධිය |

### 1.1.1. ශිෂ්‍ය ප්‍රජාව පිළිබඳ විස්තර

2018 වර්ෂය තුළ විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය ජනගහනය 2,503 ක් විය.






*1.1 උපාධිධාරීන් පිළිබඳ විස්තර*

පෙර ශිෂ්‍ය කාණ්ඩ අටෙහිඋපාධිධාරීන් විවිධ ක්ෂේත්‍රවල රැකියා සඳහා විගසින් බඳවා ගන්නා ලදී. ඒ අනුව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ඉහළ රැකියා නියුක්ති හැකියා අනුපාතයකින් යුතුව සිය උපාධිධාරීන් සඳහා දීප්තිමත් අනාගතයක් තහවුරු කරයි.

*1.1 වගුව උපාධිධාරී ප්‍රතිදානය - 2011-2018*

| උපාධි වැඩසටහන | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| සත්ව විද්‍යාව | 28 | 29 | 36 | 50 | 35 | 42 | 31 | 62 | 313 |
| අපනයන කෘෂිකර්මය | 27 | 32 | 38 | 37 | 31 | 43 | 34 | 44 | 286 |
| තේ තාක්ෂණවේදය හා අගය එකතු කිරීම | - | - | 40 | 42 | 37 | 43 | 19 | 39 | 220 |
| ජලජ සම්පත් තාක්ෂණවේදය | - | - | - | 47 | 39 | 39 | 26 | 44 | 195 |
| තාලවෘක්ෂ හා ක්ෂීර තාක්ෂණවේදය | - | - | - | 39 | 38 | 44 | 17 | 33 | 171 |
| විද්‍යාව හා තාක්ෂණවේදය | 32 | 38 | 38 | 35 | 41 | 35 | 51 | 52 | 322 |
| පරිගණක විද්‍යාව හා තාක්ෂණවේදය | 31 | 36 | 43 | 39 | 40 | 42 | 68 | 50 | 349 |
| කර්මාන්ත තොරතුරු තාක්ෂණවේදය | - | - | 41 | 40 | 43 | 40 | 31 | 52 | 247 |
| ඛනිජ සම්පත් හා තාක්ෂණවේදය | - | - | 49 | 36 | 34 | 31 | 39 | 45 | 234 |
| ව්‍යවසායකත්වය හා කළමනාකරණය | 30 | 38 | 52 | 47 | 47 | 49 | 44 | 54 | 361 |
| සත්කාරකත්වය, සංචරණය හා උත්සව කළමනාකරණය | - | - | - | 32 | 51 | 42 | 50 | 48 | 223 |
| එකතුව | 148 | 173 | 337 | 444 | 436 | 450 | 410 | 523 | 2921 |




*1.2 රූපය රැකියා නියුක්ත කළ හැකි බව - 2018*

2018 වර්ෂය තුළ උපාධි වැඩසටහන් 11 ක ශිෂ්‍ය-ශිෂ්‍යාවන් 523 දෙනෙක් උපාධි ලැබූහ.1.2 රූපයේ දක්වෙන පරිදි, 2018 අගෝස්තු මාසයේ පැවති උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වූ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් අතරින් සියයට 74.01 ක් රැකියා නියුක්ත වූ අතර රැකියා විරහිතව සිටියේ සියයට 25.99 ක් පමණි.

## 1.1.2. අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පිළිබඳ සමස්ත සටහන

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ස්ථාපිත කළ තැන් පටන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති විසින් කුලපතිවරුන් තිදෙනකු හා උපකුලපතිවරුන් සිව්දෙනකු පත් කරන ලදී. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයෙහි අධ්‍යයන, පරිපාලන හා සේවා අංශයන්හි විහිදුණු **289** දෙනකුගෙන් යුත් ස්ථිර කාර්ය මණ්ඩලයක් ඇත.

*1.2 වගුව මුළු ස්ථිර කාර්ය මණ්ඩලය -2012-2018*

| වර්ගය | | වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | මහාචාර්යවරු | - | - | - | - | 02 | 06 | 6 |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු | 10 | 13 | 21 | 38 | 45 | 51 | 53 |
| | කථිකාචාර්ය / කථිකාචාර්ය (පරිවාස) | 75 | 78 | 66 | 63 | 69 | 78 | 92 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | | 15 | 13 | 16 | 16 | 16 | 21 | 21 |
| පුස්තකාල කාර්ය මණ්ඩලය | | 03 | 03 | 03 | 03 | 03 | 03 | 4 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 04 | 04 | 04 | 40 | 73 | 130 | 133 |
| එකතුව | | 107 | 111 | 110 | 160 | 208 | 289 | 309 |

අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල පුරප්පාඩුවලින් බොහොමයක් පුරවා ඇති අතර මීළඟ වර්ෂයයේ මිනිස්බල අවශ්‍යතා සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය වෙත ඉල්ලීමක් කර තිබේ. 2018වර්ෂය තුළදී සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය සඳහා 9දෙනකුද, විද්‍යා හා තාක්ෂණවේද පීඨය සඳහා 04දෙනකුද, වශයෙන් නව අධ්‍යයන පත්කිරීම් සිදුකරන ලදී. තවද පරිපාලන ප්‍රභේදය සඳහා නව පත්කිරීම් 6ක් සිදුකරන ලදී.

### 1.1.3 මූල්‍ය විශේෂතා

2018 වර්ෂයේදී පුනරාවර්තන වියදම්වල හා මූලධන වියදම්වල මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත. ඒ අනුව, සමස්ත පුනරාවර්තන වියදමෙන් **62**%ක් පුද්ගල පඩිනඩි සඳහා වැය කරනු ලැබූ අතර, ඉතිරිය වෙනත් වියදම් පියවනු පිණිස වැය විය.




*1.3 රූපය පුනරාවර්තන වියදම් සංයුතිය*




*1.4 රූපය ප්‍රාග්ධන වියදම් සංයුතිය*

පහත වගු පසුගිය වර්ෂ 5 තුළ එක් ශිෂ්‍යයකු සඳහා පිරිවැය සාරාංශය දක්වයි.

*1.3 වගුව ශිෂ්‍යයකුට පිරිවැය2014-2018*

| වර්ෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| ශිෂ්‍ය සංඛ්‍යාව | 1900 | 1956 | 2046 | 2250 | 2502 |
| ශිෂ්‍යයකුට පිරිවැය - පුනරාවර්තන (රු. '000) | 241 | 273 | 339 | 397 | 436 |
| ශිෂ්‍යයකුට පිරිවැය - ප්‍රාග්ධන (රු. '000) | 83 | 90 | 134 | 236 | 183 |

## 1.2 සාධනතා

### 1.2.1 යටිතල පහසුකම්

අභිනවයෙන් ගෘහභාණ්ඩ සම්පාදනය කරන ලද සනාතන මණ්ඩල සභා ගර්භය 2018 ජනවාරි 2 වන දින විවෘත කරන ලදී. අභිනවයෙන් තනන ලද වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සහ ප්‍රධාන ආරක්ෂක කාර්යාලය සඳහා වූ කාර්යාලද 2018 අගෝස්තු 21 වන දින විවෘත කරන ලදී.

### 1.2.2 අධ්‍යයන හා පර්යේෂණ සාධනතා

#### 1.2.2.1 ඉංග්‍රීසි භාෂා ශික්ෂණ අධ්‍යයනාංශය පිහිටුවීම

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 9 වන අධ්‍යයනාංශය වන ඉංග්‍රීසි භාෂා ශික්ෂණ අධ්‍යයනාංශය (DELT) 2018 ඔක්තෝබර් 31 වන දින ආරම්භ කරන ලදී. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පදවිය හොබවන මහාචාර්ය රජීව විජේසිංහ මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් මෙම අවස්ථාව ශෝභාමත් කළේය.

#### 1.2.2.2 පීඨ යෝජනා ජයග්‍රාහකයෝ - ලෝක බැංකු අරමුදල් සම්පාදිත 'උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය කඩිනම් කිරීමේ වැඩසටහන' ( AHEAD - අහෙඩ්)

කළමනාකරණ පීඨය හා විද්‍යා හා තාක්ෂණවේද පීඨය උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය කඩිනම් කිරීමේ වැඩසටහන යටතේ පිරිනමනු ලබන එල්ටා-එල්ස් (ඉගෙනීම, ඉගැන්වීම, ඇගැයීම හා ඉංග්‍රීසි භාෂා කුසලතා පෝෂණය කිරීමේ සංවර්ධන ව්‍යාපෘති) ප්‍රදානයන් දිනා ගත්හ.ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල ප්‍රථම තරගකාරී ප්‍රදාන ජයග්‍රාහකයින් වශයෙන් එම එක් එක් පීඨයට රුපියල් මිලියන 100 බැගින් ප්‍රදානය කරන ලදී.

#### 1.2.2.3. ජාත්‍යන්තර පර්යේෂණ විද්වත් සැසිය 2018 (IRSUWU)

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2 වන ජාත්‍යන්තර පර්යේෂණ විද්වත් සැසිය 2018 පෙබරවාරි 1-3 දක්වා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය පරිශ්‍රයේදී පවත්වන ලදී.විශේෂ ආරාධිත අමුත්තා වන කොස්ට් (විද්‍යාව, තාක්ෂණවේදය හා නව්‍යකරණය සඳහා වූ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය) ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ මහාචාර්ය අජිත් ද අල්විස් ''සොබාදහම - අවසන් දේශසීමාව'' යන මැයෙන් දේශනයක් පැවැත්වීය. මහාචාර්ය එල්.සී. ද සිල්වා (බෲනායි), මහාචාර්ය ගිරිශ් නාත් ජා (ඉන්දියාව) සහ මහාචාර්ය ශිරීන් (ඊජිප්තුව) යන මහාචාර්යවරු පූර්ණ සැසියේදී ප්‍රධාන දේශන පැවැත්වූහ. තාක්ෂණික සැසි තේමා ක්ෂේත්‍ර 12 ක් යටතේ පවත්වන ලද අතර එහිදී පර්යේෂණ පත්‍රිකා 425 ක් ඉදිරිපත් කරන ලදී. 2018 පෙබරවාරි 3 වන දින නුවර එළිය හෝටන් තැන්න වෙත සංචාරයක් ද සමගින් ජාත්‍යන්තර පර්යේෂණ විද්වත් සමුළුව සාර්ථකව සමාප්ත කරන ලදී.

#### 1.2.2.4. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 8 වන පොදු උපාධි ප්‍රදානෝත්සවය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 8 වැනි පොදු උපාධි ප්‍රදානෝත්සවය 2018 අගෝස්තු 11 වැනි දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කුලපති ත්‍රිපිටකාචාර්ය ධර්ම කීර්ති ශ්‍රී සුමංගල රතනපාල ධම්මරක්ඛිත අති පූජ්‍ය බෙන්ගමුවේ ශ්‍රී ධම්මදින්න නායක හිමියෝ ප්‍රථම උපාධි 523 ක් ප්‍රදානය කළහ.

සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය උපාධි වැඩසටහන් 5 ක් යටතේ ප්‍රථම උපාධි 222 ක්ද, විද්‍යා හා තාක්ෂණවේද පීඨය උපාධි වැඩසටහන් 4 ක් යටතේ ප්‍රථම උපාධි 199 ක්ද, කළමනාකරණ පීඨය

උපාධි වැඩසටහන් 2 ක් යටතේ ප්‍රථම උපාධි 102 ක්ද ප්‍රදානය කර ඇත. ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ ජෙනරාල් හා මොරටුව විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති මහාචාර්ය ආනන්ද ජයවර්ධන උපාධි ප්‍රදානෝත්සව දේශනය පැවැත්වීය.

**1.2.2.5. වඩාත් කැපී පෙනෙන තරුණ පර්යේෂකයා සඳහා වූ උපකුලපති සම්මානය**

2016 වර්ෂයේ වඩාත් කැපී පෙනෙන තරුණ පර්යේෂකයා සඳහා වූ උපකුලපති සම්මානය 2018 පෙබරවාරි 1-3 දිනයන්හිදී පවත්වන ලද 2018 ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේදී සත්ව විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ඩී.කේ.ඩී.ඩී. ජයසේන වෙත ප්‍රදානය කරන ලදී. **2015** තුළ ඉහළම උධෘත සඳහා වූ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය පර්යේෂණ ප්‍රදානය ද එහිදී මහාචාර්ය ජයසේන වෙත ප්‍රදානය කරන ලදී.

**1.2.2.6. වඩාත් කැපී පෙනෙන ආචාර්ය උපාධි නිබන්ධය සඳහා වූ සම්මානය - තාක්ෂණවේදය පිළිබඳ ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලය**

විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශයට අනුයුක්ත ආචාර්ය ආර්.එම්. ඉඳුනිල් රත්නායක වෙත 2017 වර්ෂයේ වඩාත් කැපී පෙනෙ ආචාර්ය උපාධි නිබන්ධය සම්මානය පිරිනමනු ලැබීය. 'ජලය පිරිපහදු කිරීම සඳහා අනෛන්ද්‍රිය-ඓන්ද්‍රිය මැටි වර්ග සංස්ලේෂණය, ලාක්ෂණීකරණය හා ව්‍යවහාරය' පිළිබඳව වූ ඇයගේ ආචාර්ය උපාධි නිබන්ධය තාක්ෂණවේදය පිළිබඳ ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයේ විධායක පීඨාධිපතිවරයාගේ සම්භාවනාවට ලක් වුණි.

**1.2.2.7. සිංහරාජ වන ගතික බිම් කැබැල්ලෙහි පර්යේෂණ සඳහා ප්‍රදානය**

විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශයේ ආචාර්ය ඊ.පී.එස්.කේ. එදිරිවීර හට සිංහරාජ වන ගතික කට්ටියෙහි පර්යේෂණ මෙහෙයවනු පිණිස රුපියල් මිලියන 18 ක පර්යේෂණ ප්‍රදානයක් පිරිනමන ලදී. මේ සම්බන්ධයෙන් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ ස්මිත්සෝනියන් සර්ම කලාපික පර්යේෂණ ආයතනය 2017 නොවැම්බර් 22 වැනි දින ගිවිසුමක් අත්සන් කර තිබුණි. සිංහරාජ වන ගතික භූමිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අයි.ඒ.යූ.එන්. ගුණතිලක, මහාචාර්ය සී.වී.එස්. ගුණතිලක, කැලෑ දෙපාර්තමේන්තුව හා ෆොරස්ට් ජියෝ ආයතනය විසින් 1993 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී.

**1ග2ග2ග8ග සිංගප්පූරුවේ බහුවිෂය ක්ෂේත්‍රීය පර්යේෂණ පිළිබඳ සමුළුවෙහි (ෂඤඵඍ) සැසියේ විශිෂ්ටතම පත්‍රිකාව**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශයට අනුයුක්ත කථිකාචාර්ය (පරිවාස) ඒ.එන්.ආර්. වීරවංශ මහතා හට 2018 අගෝස්තු 23-25 දිනයන්හි සිංගප්පූරුවේ පැවති බහුවිෂය ක්ෂේත්‍රීය පර්යේෂණ පිළිබඳ 8 වන සමුළුවෙහි (ICMR) සැසියේ විශිෂ්ටතම පත්‍රිකාව සඳහා වූ සම්මානය පිරිනමන ලදී. මෙම සමුළුව පිලිපීනයේ පර්යේෂණ ආයතන සඳහා වූ සංගමය (PAIR) විසින් සංවිධානය කරන ලදී.

**1.2.2.9. හොංකොං විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පශ්චාත් උපාධි විද්වත් සම්මුළුවේදී කැපීපෙනෙන පෝස්ටර් ඉදිරිපත් කිරීම පිළිබඳ සම්මානය**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සත්ව විද්‍යා අධ්‍යයනාංශයට අනුයුක්ත කථිකාචාර්ය ටී.එස්.ආර්. ප්‍රනාන්දු මිය හොංකොං හි හොංකොං විශ්වවිද්‍යාලයේදී 2018 දෙසැම්බර් 5-6 දිනවල පැවති 23 වන පර්යේෂණ පශ්චාත් උපාධි විද්වත් සමුළුවේදී (RPS) 'කැපී පෙනෙන පෝස්ටර් ඉදිරිපත් කරන්නා' සම්මානය දිනා ගත්තාය. මෙම සමුළුව ලී කා ෂිං වෛද්‍ය පීඨය සහ හොංකොං විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික වැඩසටහනකි.

**1.2.2.10. ඉන්දියාවේ ඉන්දීය කළමනාකරණ ආයතනයෙහි (IIM) 'පුස්තකාලයාධිපතිත්වයෙහි පිබිද එන ප්‍රවණතා පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේදී' සමුළුවේ විශිෂ්ටතම පත්‍රිකාව සම්මානය**

ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති ආචාර්ය ටී. ප්‍රදීපන් වෙත ඉන්දියාවේ ඉන්දීය කළමනාකරණ ආයතනයෙහි 2018 දෙසැම්බර් 10-12 දිනවල පැවති 'පුස්තකාලයාධිපතිත්වයෙහි පිබිද එන ප්‍රවණතා පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේදී' සමුළුවේ විශිෂ්ටතම පත්‍රිකාව සම්මානය පිරිනමන ලදී.

**1.2.2.11. කෘෂිකර්මය හා අගය එක් කිරීම පිළිබඳ ජර්නලය (JAVA) දොරට වැඩීම**

කෘෂිකර්මය හා අගය එක් කිරීම පිළිබඳ ජර්නලය (JAVA) 2018 මැයි 31 වන දින සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයේ පර්යේෂණ ජර්නලය ලෙස දියත් කරන ලදී. එහිදී වයඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය තිලක් අත්තනායක කෘෂිකර්මය හා අගය එක් කිරීම පිළිබඳ දේශනයක් පැවැත්වීය.

**1.2.2.12. මිනිරන් පිළිබඳව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය පර්යේෂණය - මූලික අධ්‍යයනය පිළිබඳ ජාතික ආයතනය (NIFS) හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමග සහයෝගිත්වය**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූලික අධ්‍යයනය පිළිබඳ ජාතික ආයතනය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමග පර්යේෂණ සහයෝගිත්වය මගින් ශ්‍රී ලාංකික (වෛරම සහිත) මිනිරන්වලට අගය එක් කිරීම සිදුකෙරේ. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය දැනටමත් පේටන්ට් බලපත් 3 ක් සඳහා අයදුම් කර ඇත. ශ්‍රී ලාංකික වෛරම සහිත මිනිරන් නැවත ආරෝපනය කළ හැකි විදුලි කෝෂ බැටරි සඳහා භාවිතා කිරීම ජාතික වශයෙන් පිළිගන්නා ලදුව මහා භාණ්ඩාගාරයේ 'ජාතික පර්යේෂණ හා සංවර්ධන ආයෝජන රාමුව (2015-2020) තුළට අන්තර්ගත කර තිබේ.

**1.2.2.13. සමුළු මූලාසනය හා සහ-සත්කාරක හවුල්කරු - 5 වන ජාත්‍යන්තර ධීවර හා ජලජීවී වගා සමුළුව**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය හා ඉන්දුනීසියාවේ මුහම්මදියා මලාං විශ්වවිද්‍යාලය විසින් ඒකාබද්ධව සත්කාරකත්වය දරන ලද ගෝලීය ධීවර හා ජලජීවී වගා අභියෝගයන්ට මුහුණ දීම පිළිබඳව වූ '5 වන ජාත්‍යන්තර ධීවර හා ජලජීවී වගා සමුළුව' (ICFA) 2018 අගෝස්තු 23-24 දිනවල කොළඹදී පවත්වන ලදී. සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයේ පීඨාධිපති මහාචාර්ය එස්.සී. ජයමාන්න මෙම සමුළුවෙහි මූලාසනාධිපති වශයෙන් සහභාගි විය.

**1.2.3. ශිෂ්‍ය සාධනතා**

**1.2.3.1. ශ්‍රී ලංකාවේ රජරට විශ්වවිද්‍යාලයේ 4 වැනි ජාත්‍යන්තර පර්යේෂණ විද්වත් සමුළුවෙහි උපාධි අපේක්ෂක පැන විසඳුම් තරගයේ ජයග්‍රාහකයෝ**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ජලජ සම්පත් තාක්ෂණවේද උපාධි වැඩසටහනේ උපාධි අපේක්ෂක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 5 දෙනෙක් ශ්‍රී ලංකාවේ රජරට විශ්වවිද්‍යාලය (RUSL) විසින් 2018 ඔක්තෝබර් 16 වන දින සිය 4 වන ජාත්‍යන්තර පර්යේෂණ විද්වත් සමුළුවට සමගාමීව, 'ජෛව විවිධත්ව හා පරිසර පද්ධති සේවා තුළ නව නිපැයුම්කරණය' යටතේ සංවිධානය කරන ලද පැන විසඳුම් තරගාවලියට සහභාගි වූහ. රාජ්‍ය විශ්වවිද්‍යාල නියෝජනය කළ කණ්ඩායම් 11 ක් සමග තරග වදිමින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල කණ්ඩායම එම තරගාවලිය ජයග්‍රහණය ලබා ඇත.

**1.2.3.2. ජාතික විශිෂ්ට ගුණාත්මකතා තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද සම්මාන 2018 - බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ ශ්‍රී ලාංකික අංශය**

පරිගණක විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් සංවර්ධනය කරන ලද 'අඹ යාලුවා' නමැති සංකේන්ද්‍රණ උපකරණය සඳහා කොළඹ ගලදාරි හෝටලයේදී 2018 ඔක්තෝබර් 19 වන දින පවත්වන ලද ජාතික විශිෂ්ට ගුණාත්මකතා තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද සම්මාන (NBQSA) රාත්‍රියේදී තෘතියික ශිෂ්‍ය ව්‍යාපෘති (තාක්ෂණවේද) ප්‍රභේදය යටතේ කුසලතා සම්මානයක් පිරිනමන ලදී.මෙම අවස්ථාව සංවිධානය කරන ලද්දේ වරලත් තොරතුරු තාක්ෂණවේද ආයතනයේ බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ (BCS) ශ්‍රී ලාංකික අංශය විසිනි.

#### 1.2.3.3. අයි.ඊ.ඊ.එක්ස්ට්‍රීම් වී.12.0

අයි.ඊ.ඊ.එක්ස්ට්‍රීම්වනාහි අයි.ඊ.ඊ. ශිෂ්‍ය සාමාජික සාමාජිකාවන් අයි.ඊ.ඊ.ඊ. සාමාජිකයකු විසින් උපදෙස් දී පුහුණු කරනු ලැබ බොහෝ විට අයි.ඊ.ඊ.ඊ. ශිෂ්‍ය ශාඛාවක සහයෝගය ඇතිව පැය 24 ක කාල පරාසයක් ඇතුළත වැඩසටහන්කරණ ගැටළු කට්ටලයක් විසඳීමෙහිලා එකිනෙකා හා තරග කරන ගෝලීය අභියෝගයකි. අයි.ඊ.ඊ.ඊ. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය ශාඛාව 2018 ඔක්තෝබර් 20-21 දිනයන්හි කණ්ඩායම් 15 යටතේ අයි.ඊ.ඊ.ඊ. ශිෂ්‍ය සාමාජික සාමාජිකාවන් 45 දෙනකුද ඇතුළත් කරමින් ජාත්‍යන්තර හැකතන් අත්දැකීමට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් නිරාවරණය කරමින් අයි.ඊ.ඊ.එක්ස්ට්‍රීම් වී.12.0 සඳහා සත්කාරකත්වය දැරීය. සියලුම කණ්ඩායම් ශ්‍රී ලාංකික මට්ටම ඇතුළත ඉහළම කණ්ඩායම් 280 ට අවතීර්ණ වීමට සමත් වූ අතර 'යූ.ඩබ්ලියු.යූ.කෝඩ්-ඕ-ඩයි කණ්ඩායම ගෝලීය ශ්‍රේණිගත කිරීම්වලින් කණ්ඩායම් 4,400 කට අධික සංඛ්‍යාවක් අතරින් 864 වන ස්ථානය දිනා ගත්තේය.

#### 1.2.3.4. තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද නව්‍යකරණ ව්‍යාපෘති

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය උපාධි අපේක්ෂක අපේක්ෂිකා කණ්ඩායමක් නවමු තොරතුරු තාක්ෂණ නිෂ්පාදන 2 ක් සොයා ගෙන ඇත.

***පයිදන් - සිංහල අර්ථකථික:*** විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් කණ්ඩායමක් පරිගණක වැඩසටහන්කරණයේ නිරත ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ භාවිතය සඳහා ලොව ප්‍රථම පයිදන් සිංහල අර්ථකථකය සංවර්ධනය කර ඇත.මෙය දැනටමත් නොමිලේ ඇති ව්‍යවහාරිකයක් වශයෙන් ගූගල් ප්ලේස්ටෝ තුළට ඇතුළත් කර ඇත.පූර්ණ වශයෙන් රැහැනින් බැහැර මෘදුකාංග ව්‍යවහාරිකයක් වන මෙම අර්ථකථකය එහි පරිහාරකයාව පියවරෙන් පියවර ආකාරයෙන් පයිදන් වැඩසටහන්කරණය පිළිබඳව විශේෂයෙක් බවට පත්කරයි.

***'නෝට් රිව්‍යූ ව්‍යවහාරිකය:*** මෙම නව නිපැයුම 2018 සහසක් නිමැවුම් 2018 තරගයේදී මෙරට විශ්වවිද්‍යාල හා තෘතියික අධ්‍යාපන ආයතන විසින් ඉදිරිපත් කරන ලද අනෙකුත් නව නිපැයුම් සියල්ල පරාජය කරමින් ප්‍රථම ස්ථානය සඳහා රන් සම්මානයක් ලබා දීම මගින් එහි නවතාව හා ව්‍යවහාරය සම්බන්ධයෙන් පිළිගැනීමට ලක්කරන ලදී.මෙම කණ්ඩායමට මෑතදී ''විශිෂ්ටතම නැනුම්කාර-අවකාශ ආරම්භකයා'' වශයෙන් ප්‍රථම ස්ථානය පිරිනමන ලද්දේ ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්වය හා තාක්ෂණවේදය බලගැන්වීම සඳහා වූ එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා හා මාලදිවයින් තානාපති කාර්යාල මූලකෘත්‍යය මගිනි.

#### 1.2.3.5. ගීකෝඩරෙස් වී.2.0

ගීකෝඩරෙස් වී.2.0 වනාහි ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය අයි.ඊ.ඊ.ඊ. ශිෂ්‍ය ශාඛාවේ ඩබ්ලියු.අයි.ඊ. හාද කණ්ඩායම විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ ප්‍රථම අන්තර් විශ්වවිද්‍යාලීය බාලිකාවන්ට පමණක් සීමා වූ හැකතන් තරගාවලිය වන අතර එහි දෙවන අදියර සර්ව-රාත්‍රික වැඩසටහනක් වශයෙන් 2018 ඔක්තෝබර් 13-14 දිනයන්හි නිරාවරණය කරන ලදී. මෙම අවස්ථාව සංවිධානය කරන ලද්දේ දිවයිනේ කාන්තා තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද ශ්‍රම බලකාය අතර කේතකරණ, වැඩසටහන්කරණ හා වෙනත් අවශ්‍ය තොරතුරු තාක්ෂණ කුසලතා ජනප්‍රිය කරවනු පිණිසය.විවිධ විශ්වවිද්‍යාලයන්හි තරගකාරියන් 156 දෙනකුගෙන් සමන්විත කණ්ඩායම් 52 ක් මෙම අවස්ථාවට සහභාගි වූහ. කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක පාසල (UCSC) සියලු තරගකරුවන් අභිභවා ප්‍රථම ස්ථාන තුනම දිනාගත්හ.

### 1.2.4. විදේශ සංචාර හා ජාත්‍යන්තර සහයෝගිතා

#### 1.2.4.1. උපකුලපතිතුමාගේ ඉන්දීය උසස් අධ්‍යාපන ආයතන තුනක සංචාරය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ජයන්ත ලාල් රත්නසේකර ඉන්දියාවේ ට්‍රිචි නුවර ඉන්දීය කළමනාකරණ ආයතනයේ (IIM) 2018 දෙසැම්බර් 10-12 දිනයන්හි පැවති 'පුස්තකාලයාධිපතිත්වයෙහි පිබිද එන ප්‍රවණතා පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේදී' ප්‍රධාන අමුත්තා විය.

උපකුලපති තුමා ප්‍රධාන දේශනය පැවැත්වීය. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී එම්.එෆ්. හිබතුල් කරීම් මහතා මෙම සමුළුවේදී විශේෂ කථාවක් පැවැත්වීය.ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය දූත පිරිස හා අයි.අයි.එම්. ට්‍රිචි බලධාරීන් අතර විභව්‍ය අනාගත සහයෝගිතා සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වන ලදී. එමෙන්ම උපකුලපති හා ලේඛකාධිකාරී දෙපළ ඉන්දියාවේ තමිල්නාඩුවේ මධ්‍යම විශ්වවිද්‍යාලය හා පෙරියර් විශ්වවිද්‍යාලය වෙත ගියහ.මෙම සංචාර මෙම විශ්වවිද්‍යාල දෙක අතර ශක්තිමත් ජාලයක් ගොඩනැගීමේ වැදගත් පියවර විය.

**1.2.4.2. චෙක් ජනරජයෙහි වන භූගෝලීය විශ්ලේෂණ වැඩමුළුව - මහාචාර්ය සිසිර එදිරිවීර**

විද්‍යා හා තාක්ෂණවේද පීඨයේ පීඨාධිපතිමහාචාර්ය සිසිර එදිරිවීර චෙක් ජනරජයේ වන ගෝලීය පෘථිවි නිරීක්ෂණාගාරයේ සර්ම කලාපික වන විද්‍යා කේන්ද්‍රය විසින් සංවිධානය කරන ලදුව 2018 ජූලි 20 වැනි දින සිට අගෝස්තු 3 වැනි දින දක්වා පවත්වනු ලැබූ සී.එෆ්.ටී.එස්. වන භූගෝලීය විශ්ලේෂී වැඩමුළුවට සහභාගි විය. මෙම වැඩමුළුව ග්ලෝබල් ෆොරස්ට් ජියෝ වන ගතිකබල ස්ථානවල දත්ත විශ්ලේෂණය පිළිබඳව අවධානය යොමු කළ අතර ලොව පුරා විද්‍යාඥයින් සමග ඒකාබද්ධව පවත්වන ලදී.

**1.2.4.3. ඉන්දියාවේ බැංගලෝරයේ දකුණු ආසියාවේ දේශගුණ ප්‍රත්‍යාස්ථතා සැලසුම්කරණය සඳහා වූ** දත්ත හා මෙවලම් පිළිබඳ වැඩමුළුව - මහාචාර්ය සිසිර එදිරිවීර

විද්‍යා හා තාක්ෂණවේද පීඨයේ පීඨාධිපතිමහාචාර්ය සිසිර එදිරිවීර ඉන්දියාවේ බැංගලෝරයේ ඉන්දීය විද්‍යා ආයතනයේ (IIS) අගෝස්තු 13-14 දිනයන්හිදී පැවති දකුණු ආසියාවේ දේශගුණ ප්‍රත්‍යාස්ථතා සැලසුම්කරණය සඳහා වූ දත්ත හා මෙවලම් පිළිබඳ වැඩමුළුවට සහභාගි විය. මෙම වැඩමුළුවේ අරමුණ වූයේ දකුණු ආසියාවේ පර්යේෂණ ප්‍රජාව, තීරණ ගන්නන් හා වෙනත් පරදු දරන්නන් අතර දේශගුණික අනුවර්තනය හා ප්‍රත්‍යාස්ථතාව පිළිබඳව සංවාදයක් සඳහා වේදිකාවක් සැපයීමයි.

**1.2.4.4. චීනයේ ලංෂෞ විශ්වවිද්‍යාලය සමග පර්යේෂණ සහයෝගිතා - මහාචාර්ය සමන් හේරත්**

සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයේ අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශයේ මහාචාර්ය සමන් හේරත් 2018 ජූලි 15 වැනි දින සිට ඔක්තෝබර් 2 වැනි දින දක්වා චීනයේ ලංෂෞ විශ්වවිද්‍යාලයේ පිටිසර කෘෂිකර්ම විද්‍යාව හා තාක්ෂණවේදය පිළිබඳ විද්‍යාලයේදී පර්යේෂණ සම්මාන සාමාජිකයකු වශයෙන් සේවය කළේය. එමෙන්ම මහාචාර්ය සමන් හේරත් 2018 සැප්තැම්බර් 25-27 දිනවල ලංෂෞ විශ්වවිද්‍යාලයෙහි පැවති 4 වන ජාත්‍යන්තර තෘණභූමි කෘෂිකර්ම සමුළුවට සහභාගි විය.

**1.2.4.5. ජාත්‍යන්තර සම්මන්ත්‍රණවල සම්පත්දායක - ආචාර්ය ටී. ප්‍රදීපන්**

ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති ආචාර්ය ටී. ප්‍රදීපන් 2018 දෙසැම්බර් 7-14 දිනයන්හිදී ඉන්දීය විශ්වවිද්‍යාල තුනක පවත්වනු ලැබූ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා වැඩමුළුවලදී සම්පත්දායකයකු ලෙස සේවය සැලසීය. එය පර්යේෂණ දර්ශක, පර්යේෂණ කළමනාකරණය, රැහැන්ගත විද්‍යාර්ථී ප්‍රකාශනය හා ශාස්ත්‍රීය විමර්ශන කළමනාකරණ මෘදුකාංග යන මාතෘකා අඩංගු දේශන හා සැසිවලින් සමන්විත විය.

### 1.2.5. සහතිකපත්‍ර මට්ටමේ වැඩසටහන්

#### 1.2.2.13. පාසල් හැරයන්නන් සඳහා ඉංග්‍රීසි සහතිකපත්‍රය

හත්වැනි ශිෂ්‍ය කාණ්ඩයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා වූ පාසල් හැරයන්නන් සඳහා ඉංග්‍රීසි සහතිකපත්‍රය සමාරම්භක උත්සවය 2018 නොවැම්බර් 18 වන දින කළමනාකරණ පීඨයේ පීඨාධිපති, කළමනාකරණ විද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රධානී, රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශ ප්‍රධානී, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්, කථිකාචාර්යවරුන්, අනධ්‍යයන කාර්ය මණ්ඩලය හා 130 කට අධික විභව්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහභාගිත්වයෙන් පවත්වන ලදී.

#### 1.2.5.2. වෙනත් වැඩසටහන්

#### 1.2.5.2.1. ඔබේ සිහින ග්‍රහණය කර ගන්න - වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළුව

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ගැවල් සමාජයේ සමග ඒකාබද්ධව සංවිධානය කරන ලද 'ඔබේ සිහින ග්‍රහණය කර ගන්න' නමැති වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළුව 2018 දෙසැම්බර් 11 වන දින පවත්වන ලදී. නූතන රැකියා ලෝකය පිළිබඳව වත්මන් දැනුම වර්ධනය කිරීම, ශිෂ්‍ය ශිෂ්‍යාවන් අවශ්‍ය මෘදු කුසලතාවන් ගෙන් ඔප් නැංවීම හා ඔවුන් කර්මාන්තය තුළට මෙහෙයවීම යන ත්‍රිත්ව අරමුණු සහිතව මෙය සංවිධානය කරන ලදී. ඒ.සී.එල්. කේබල්ස් *පී.එල්.සී.*ආයතනයේ සාමාන්‍යාධිකාරී ඩෙන්සිල් පෙරේරා මහතා සහ විකිණුම් ප්‍රධානී දීප්ති බණ්ඩාර මහතා සම්පත්දායකයින් වශයෙන් සිය දායකත්වය ලබා දුන්හ.

#### 1.2.5.2.2. 'යූ.ඩබ්ලියු.යූ. ක'රියර් එක්ස්පෝ' ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය වෘත්තීය ප්‍රදර්ශනය - 2018

'යූ.ඩබ්ලියු.යූ. ක'රියර් එක්ස්පෝ' ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය වෘත්තීය ප්‍රදර්ශනය" 2018 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් ආචාර්යවරුන් හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ විභව්‍ය කර්මාන්ත හා සේවා අංශ සේව්‍යයින්, මානව සම්පත් උපදේශකවරුන් හා වෘත්තීය උපදේශන ආයතන අතර අන්තර්ක්‍රියාකාරිත්වය සඳහා වේදිකාවක් සපයනු පිණිස සංවිධානය කරන ලදී.මෙය 2018 ඔක්තෝබර් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය පරිශ්‍රයේදී පවත්වන ලදී.විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් සම්පත්දායකයින් 17 දෙනෙක් සිය අත්දැකීම් බෙදාහදා ගනිමින් වෘත්තීය ඉඩප්‍රස්ථා පිළිබඳව ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කළහ.

### 1.2.6. පුස්තකාලය

#### 1.2.6.1. රැහැන්ගත නාමාවලිය හා පුස්තකාල කළමනාකරණ පද්ධතිය

පුස්තකාලය පරිහරණය කරන්නන් සඳහා සේවාවන් දියුණු කිරීමේ හා ව්‍යාප්ත කිරීමේ අරමුණ ඇතිව රැහැන්ගත නාමාවලිය හා පුස්තකාල කළමනාකරණ පද්ධතිය දියත් කර ඇත. මෙම පද්ධතිය 'කෝහා' නමැති විවෘත-මූලාශ්‍ර මෘදුකාංගය මත පදනම්ව ඇත. පුස්තකාල කළමනාකරණ පද්ධතිය විධිමත් ලෙස දියත් කිරීම 2018 පෙබරවාරි 5 වන දින සිදුවිය.

#### 1.2.6.2. කෘති අනවසර උපුටනය රැහැන්ගතව සෙවීම පිළිබඳ වැඩමුළුව

යූ.ජී.සී.-කොන්සැල් මූලකෘත්‍යයක් වශයෙන්, යුර්කැන්ඩ් රැහැන්ගත මෙවලම භාවිතයෙන් කෘති අනවසර උපුටනය පිළිබඳව ගැටළුව හසුරුවා ගැනීම සඳහා වූ පූර්ණ ස්වයංක්‍රීත පද්ධතියක් හඳුන්වා දීමේ කාර්යය උදෙසා පුස්තකාලය විසින් කෘති අනවසර උපුටන සෙවීමේ රැහැන්ගත මෙවලම පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. 2018 සැප්තැම්බර් 26 වන දින පැවති මෙම වැඩමුළුවට 75 දෙනකුට අධික අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් සංඛ්‍යාවක් සහභාගි වූහ.

#### 1.2.6.3. පුස්තකාලය භාවිතය




වත්මන් පුස්තකාලය මුද්‍රිත හා මුද්‍රිත නොවන සම්පත් 20□500 කට අධික එකතුවකින් සමන්විත වන අතර, පරිගණක විද්‍යාව හා දර්ශනවාදය යන විෂය ක්ෂේත්‍රවල විශාල වපසරියක් ආවරණය කරන එකතුවක් එය සතුය.

2018 වර්ෂය තුළ පුස්තකාලය සිය පරිභාරකයින්ගේ අවශ්‍යතාවන් සපුරනු පිණිස රුපියල් මිලියන 18 ක් ඉක්මවන වටිණාකමකින් යුතු ග්‍රන්ථ මිලට ගෙන තිබුණි.

| වර්ෂය | පිටපත් සංඛ්‍යාව |
|---|---|
| 2017 | 525 |
| 2018 | 1550 |

### 1.2.7 සාම්ප්‍රදායික හා සංස්කෘතික ඉසව්

විවිධාකාරී වූ සංස්කෘති, සම්ප්‍රදායන්, ආගම් හා උත්සව අතර සහජීවනය සහතික කිරීම් අරමුණ ඇතිව, 2018 වර්ෂය තුළ වැඩසටහන් ගණනාවක් පවත්වන ලදී.

#### 1.2.7.1. වෙල්ලස්ස කෝණ මංගල්‍යය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික නව අවුරුදු උළෙල වන 2018 වෙල්ලස්ස කෝණ මංගල්‍යය 2018 අප්‍රේල් 22 වන දින ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී.මෙම උත්සවය වාර්ගික හා ආගමික මායිම්වලින් ඔබ්බට උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් අතරේ එක්සත්කම හා සමාදානය වර්ධනය කරන අතරම සිංහල හා දමිළ චාරිත්‍ර අගය කිරීමේ මුඛ්‍ය පරමාර්ථය ඇතිව සංවිධානය කරන ලදී. මෙම උළෙල අළුත් අවුරුදු ක්‍රීඩා හා වෙනත් විනෝදාත්මක ක්‍රියාකාරකම්වලින් සමන්විත වූ අතර සිංහල හා දමිළ රසකැවිලි අළුත් අවුරුදු කෑම මේසය ප්‍රණීත එකක් බවට පත් කළේය.

#### 1.2.7.2. නමුණුකුල වෙසක් සඳ - 2018

වාර්ෂික වෙසක් වැඩසටහන වන 2018 නමුණුකුල වෙසක් සඳ වැඩසටහන 2018 මැයි 31 දින සිට ජූනි 3 වනදා දක්වා පවත්වන ලදී.ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආධ්‍යාත්මික මෙන්ම සෞන්දර්යාත්මක සාරධර්ම වර්ධනය කිරීම උදෙසා උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් විසින් සංවිධානය කරන ලද වෙසක් කුඩු තරගය හා වෙසක් භක්ති ගී සන්දර්ශනය ඇතුළු වැඩසටහන් මාලාවක් පවත්වන ලදී.

**1.2.7.3. ගැලෙනා 2018 - අලෝහා - ආකෘතියෙන් මිදෙමු**

මාහැඟි භෝජනය හරහා හවායි සංස්කෘතියේ විචිත්‍ර වර්ණ පිළිබඳව අමුත්තන් 180 දෙනකුට ජීවිත කාලයට වරක් පමණක් ලැබෙන අත්විඳීමක් ඇති කරමින්, අලෝහා - ආකෘතියෙන් මිදෙමු යන තේමාව යටතේ 2018 මැයි 18 වන දින විශ්වවිද්‍යාලීය පරිශ්‍රයේදී ගැලෙනා 2018 නමැති වැඩසටහන පවත්වන ලදී. මෙය සත්කාරකත්ව, සංචරණ හා උත්සව කළමනාකරණ උපාධි වැඩසටහනේ ප්‍රධානතම වාර්ෂික අවස්ථාවක් බවට පත්ව තිබේ.

**1.2.7.4. අතැඹුල = සුසංගත සන්ධ්‍යාව**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කලා හා විචාරාත්මක කුසලතා ඔප් නංවනු පිණිස අතැඹුල = සුසංගත සන්ධ්‍යාව 2018 ජූනි 11 වන දින ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය ශ්‍රවනාගාරයේදී වේදිකාගත කරන ලදී. ප්‍රවීණ ගායක විශාරද සරත් පීරිස්ගේ හඬ මෙම සන්ධ්‍යාවට මනා ආකර්ෂණයක් එක් කළ අතර කලා විචාරක ජනහිත විජේබණ්ඩාර මහතා ශ්‍රී ලංකාවේ කලා හා සංගීත කරළිය පිළිබඳව අගනා විචාරයක් සිදු කළේය. මෙම වැඩමුළුව සුවිශේෂී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල විෂයමාලාවේ පුළුල් පොදු අධ්‍යාපනයේ කොටසක් වන සෞන්දර්ය අධ්‍යයනය විෂයය අර්ධ වශයෙන් ඉෂ්ටසිද්ධ කිරීමක් වශයෙන් පවත්වන ලදී.

**1.2.7.5. මනුසත් හඬ = 2018**

කලා සංසදය විසින් සංවිධානය කරන ලද මනුසත් හඬ = 2018 ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය කලා උළෙල රූකඩ සන්දර්ශන, සිනමා සතිය සහ ආ තරුණ සංගීත කණ්ඩායම නිරූපනය කරන ගෝෂා මධුර සංගීත රාත්‍රිය වැනි වැඩසටහන් මාලාවක් සමගින් 2018 ඔක්තෝබර් 29 වන දින සිට නොවැම්බර් 17 වන දින දක්වා පවත්වන ලදී. නිද්‍රා හා භාව සංකලන නමැති වැඩසටහන් සංගීත කවයේ හා රංගන කවයේ සුවිශේෂී සංගීත හා නර්තන රැඟුම් ඉදිරිපත් කරන උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන්ගේ නිර්මාණශීලීත්වය හා දක්ෂතා එළි දක්වන විශ්වවිද්‍යාලාභ්‍යන්තර වැඩසටහන් විය.

**1.2.7.6. ඕරෝරා 2018**

සත්ව විද්‍යා අධ්‍යයනාංශය විසින් සංවිධානය කරන ලද ඕරෝරා 2018 ආහාර උළෙල 2018 සැප්තැම්බර් 28 වන දින පවත්වනු ලැබූ අතර ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල පවුල වෙත අමතක නොවන සූප අත්දැකීමක් ඉන් පිරිනැමුණි.

**1.2.7.7. ප්‍රභූ භෝජන රාත්‍රිය**

සත්කාරකත්ව, සංචරණ හා උත්සව කළමනාකරණ උපාධි වැඩසටහනේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් සංවිධානය කරන ලද ප්‍රභූ භෝජන රාත්‍රිය 2018 ඔක්තෝබර් 8 වැනි දින ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය පරිශ්‍රයේදී පවත්වන ලදී.

**1.2.7.8. මලෙයිතේන්ඩ්‍රල් - 2018**

මලෙයිතේන්ඩ්‍රල් යනු විශ්වවිද්‍යාලයේ සංස්කෘතික විවිධත්වය ප්‍රදර්ශනය කරමින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කලා හා සංස්කෘතික වටිණාකම් ප්‍රවර්ධනය කරනු පිණිස දමිළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමගින් සංවිධානය කරන ලද වාර්ෂික වැඩසටහනකි. මෙම වැඩසටහන පස්වන වරටත් බදුල්ල පුස්තකාල ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී.

**1.2.7.9. ඇඩෙස්ටේ ෆිඩෙලිස් ඩොරතියා - 2018**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික නත්තල් බැති ගී උළෙල 2018 දෙසැම්බර් 5 වන දින ඇඩෙස්ටේ ෆිඩෙලිස් ඩොරතියදමකා යන තේමාව යටතේ පවත්වන ලදී. මෙම අවස්ථාව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල පවුලේ සාමාජික සාමාජිකාවන් අතර නත්තල් ප්‍රීතිය බෙදාහදා ගනු පිණිස සංවිධානය කරන ලදී.

**1.2.7.10. පිරිත් සජ්ඣායනය**

වාර්ෂික සර්ව-රාත්‍රික පිරිත් සජ්ඣායන උත්සවය ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල පවුලේ සියලු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ හා කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ගේ සහභාගිත්වය ඇතිව 2018 දෙසැම්බර් 8 වන දින පවත්වනු ලැබීය. දෙසැම්බර් 9 වන දින උදෑසන පූජ්‍ය මහා සංඝරත්නය උදෙසා දානයක් පිළිගැන්වීමේ මහඟු අවස්ථාව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල පවලට උදාවුණි. මුතියංගන රජමහා විහාරයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් බැතිමතුන්ට ධර්මානුශාසනයක් කරන ලදී.

### 1.2.8. ප්‍රජා බැහැර අවතීර්ණ වැඩසටහන්

#### 1.2.8.1. තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද දැනුම හා කුසලතා පරතරය පියවීම

පරිගණක විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශය විසින් තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද දැනුම හා කුසලතා පරතරය පියවමින් පාසල් ප්‍රජාව සමග සිය දීර්ඝ කාලීන සබඳතාව ශක්තිමත් කරනු පිණිස 2018 ජූනි 15 වන දින පරිගණක ජාලකරණය පිළිබඳව වැඩමුළුවක් පැවැත්වීය.මෙහි ඉලක්ක කණ්ඩායම වූයේ කරවිට මධ්‍ය මහා විද්‍යාලයේ අ.පො.ස. උසස් පෙළ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ හා ගුරුවරු ය.

#### 1.2.8.2. පොසොන් දන්සල

පාසල් හැරයන්නන් සඳහා ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාවේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 2018 මැයි 29 වන පසළොස්වක පෝය දින බදුල්ල පළාත් සභාව ඉදිරිපිට අධි පොසොන් පොහොය දන්සලක් සංවිධානය කළහ.

#### 1.2.8.3. සිප්මංකඩ - 2018

කලා සංසදය විසින් සංවිධානය කරන ලද වාර්ෂික ක්‍රියාකාරකම වූ සිප්මංකඩ 2018 කථිකාචාර්යවරුන්ගේ හා උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන්ගේ සහභාගිත්වයෙන් 2018 ජූනි 12 වන දින මැටිගහතැන්න මහා විද්‍යාලයේදී පවත්වන ලදී.වර්තමානයෙහි අධ්‍යාපනයේ ඇති වැදගත්කම පෙන්වා දීම පිණිස උදෑසන සැසිය පවත්වනු ලැබූ අතර, ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට සෞන්දර්ය වින්දනයක් ලබා දුන් උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන්ගේ කුසලතාවන් ගෙන් සන්ධ්‍යාව වර්ණවත් විය.

#### 1.2.8.4. 1818 ඌව කැරැල්ල අනුස්මරණය

1818 ඌව කැරැල්ල අනුස්මරණය කිරීම පිණිස වූ පාසල් සම්මන්ත්‍රණය බදුල්ල පාසල් දරුවන්ගේ සහභාගිත්වයෙන් 2018 මාර්තු මස සයිමන් පීරිස් ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී.ඉන්දික තෙන්නකෝන් මහතා සහ ජගත් කුලතිලක මහතා සම්පත්දායකයින් වශයෙන් සහභාගි වූහ.මෙම වැඩසටහන ඌව පළාතේ සංස්කෘතික අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලදී.

#### 1.2.8.5. ජනමාධ්‍ය සම්මන්ත්‍රණ මාලාව

උසස් පෙළ ජනමාධ්‍ය විෂය ධාරාවේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ජනමාධ්‍යවේද සම්මන්ත්‍රණ මාලාවක් 2018 නොවැම්බර් මාසයේදී බදුල්ල, බණ්ඩාරවෙල හා මහියංගනය තුළ පවත්වන ලදී.මෙම සම්මන්ත්‍රණ මාලාව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා රජයේ තොරතුරු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. 750 දෙනකුට ආසන්න උසස් පෙළ ජනමාධ්‍යවේද ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාවක් මෙම සම්මන්ත්‍රණ මාලාවට සහභාගි වූහ.

#### 1.2.8.6. පොත් පරිත්‍යාගය

වැඩිහිටි නිවාසවල වෙසෙන වයෝවෘද්ධ අයට පොත් කියවා රසවිඳීමේ අවස්ථාව ලබා දෙනු පිණිස ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය පුස්තකාලය විසින් සංවිධානය කරන ලද පොත් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් 2018 අගෝස්තු 8 වන දින පවත්වන ලදී.බදුල්ල කයිලගොඩ හා රිදීපාන වැඩිහිටි නිවාසවලට පොත් 500 කට අධික සංඛ්‍යාවක් පරිත්‍යාග කරන ලදී.

#### 1.2.8.7. ඒ.එන්.එස්. රුධිර පරිත්‍යාග වැඩසටහන 2018

වාර්ෂිකව පැවැත්වෙන උතුම් කටයුත්තක් වූ 2018 ඒ.එන්.එස්. රුධිර පරිත්‍යාග වැඩසටහන බදුල්ල මධ්‍යම රුධිර බැංකුවේ සහයෝගය ඇතිව සත්ව විද්‍යා උපාධි වැඩසටහනේ 3 වන වසර උපාධි

අපේක්ෂක අපේක්ෂිකාවන් විසින් සංවිධානය කරන ලදුව 2018 නොවැම්බර් 8 වන දින 10 වැනි වරටත් පවත්වන ලදී. මෙය ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය ඉසව් කාලසටහනෙහි ප්‍රධාන ප්‍රජා සේවා ක්‍රියාකාරකමක් වන අතර මෙම වර්ෂයේ වැඩසටහන සාර්ථක කර ගැනීම උදෙසා රුධිර පරිත්‍යාගශීලීන් 200 කට අධික සංඛ්‍යාවක් සිය නොමසුරු සහයෝගය ලබා දුන්හ.

### 1.2.8.8. විදු නිම්සර 2018

වාර්ෂික ප්‍රජා සත්කාර වැඩසටහනක් වන විදු නිම්සර2018 ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ විද්‍යා හා තාක්ෂණවේද උපාධි වැඩසටහනේ උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් විසින් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන 2018 වර්ෂයේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ගණිතය පිළිබඳ සම්මන්ත්‍රණවලින් සමන්විත විය.මෙය බදුල්ල, මොණරාගල හා අම්පාර ප්‍රදේශයන්හි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා 2018 නොවැම්බර් 5 වන දින පවත්වන ලදී.

### 1.2.8.9. ක්‍රීඩෝ විසින් පරිත්‍යාග වැඩසටහන

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ව්‍යවසායිකයින්ගේ සමාජය වන ක්‍රීඩෝ විසින් පරිත්‍යාග වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙම කටයුත්ත ප්‍රථම වරට 2018 නොවැම්බර් 30 වන දින බදුල්ල විදියගම මහා විද්‍යාලයේදී මෙම සමාජයේ සමාජ සුභසාධන ක්‍රියාකාරකමක් ලෙස පවත්වන ලදී. කථිකාචාර්යවරුන්ගේ, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ඥාතීන්ගේ හා ක්‍රීඩෝ සමාජයේ සාමාජික සාමාජිකාවන්ගේ සහයෝගය ඇතිව නිල ඇඳුම් රෙදි, මලු, වතුර බෝතල්, පොත් හා පෑන් පරිත්‍යාග කරන ලදී.ක්‍රීඩෝ සමාජය මෙම පරිත්‍යාග වැඩසටහන වාර්ෂික ප්‍රජා සේවා සත්කාර ක්‍රියාකාරකම්වලින් එකක් ලෙස අඛණ්ඩව සිදු කරනු ඇත.

### 1.2.8.10. අඳුරු ජීවිතවලට බලාපොරොත්තුවේ කිරණක්

ව්‍යවසායකත්ව හා කළමනාකරණ උපාධි වැඩසටහනේ උපාධි අපේක්ෂක අපේක්ෂිකාවෝ 'අඳුරු ජීවිතවලට බලාපොරොත්තුවේ කිරණයක්' යන තේමාව යටතේ 2018 නොවැම්බර් 11 වන දින බදුල්ල කයිලගොඩ මෙත්සෙවන වැඩිහිටි නිවාසයේදී වාර්ෂික දාන පිංකම සංවිධානය කළහ.උපාධි අපේක්ෂක අපේක්ෂිකාවෝ එදින වැඩිහිටි නිවාසය පිරිසිදු කොට වැඩිහිටියන්ටද පිරිසිදු වීමට උපකාර කළහ. සන්ධ්‍යාවේදී තේපැන් හා සරල ආහාරයකින් සංග්‍රහ කිරීමෙන් අනතුරුව විනෝදාශ්වාද සැසියක්ද පවත්වන ලදී.

### 1.2.8.11. ලෝක සංචාරක දිනය 2018

සත්කාරකත්ව, සංචරණ හා උත්සව කළමනාකරණ උපාධි වැඩසටහනේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් ඌව පළාත් සභාවේ සහයෝගිත්වයෙන් 2018 සැප්තැම්බර් 27-28 දිනයන්හිදී ලෝක සංචාරක දිනය සමරන ලදී.ඌව පළාතේ සංචරණය ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම්වලින් එකක් වශයෙන් ඇල්ල ප්‍රදේශයේදී ශ්‍රමදාන ව්‍යාපාරයක්ද සංවිධානය කරන ලදී.

### 1.2.8.12. සැවුල් මණ්ඩපය 2018

සත්ව විද්‍යා අධ්‍යයනාංශය විසින් සංවිධානය කරන ලද 'කුකුළු ලෝකයේ අනාගතය : වඩා ඥානවන්ත හා හරිත නිෂ්පාදනය පිළිබඳ දෙවන සැවුල් මණ්ඩපය 2018' නමැති වැඩසටහන 2018 සැප්තැම්බර් 28 වන දින විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙම වැඩසටහනට ක්‍රිස්බ්‍රෝ සමාගම් සමූහය හා බොහෝ යහප්‍රාර්ථනා කරන්නෝ සම-සත්කාරකත්වය දැරූහ. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික විශ්වවිද්‍යාල 3 හි සහභාගිකයින් 250 කට අධික සංඛ්‍යාවක්ද සමගින් පර්යේෂණ ආයතන හා කර්මාන්තය තුළ විශේෂඥයින් මෙම මණ්ඩපයට සහභාගි වූ අතර විශ්වවිද්‍යාලයන්හි හා පර්යේෂණ ආයතනයන්හි ආරාධිත දේශකයින් 5 දෙනෙක් කුකුළු කර්මාන්තය ආශ්‍රිත සිය විශේෂිකෘත ක්ෂේත්‍රයට අදාළ දේශන පැවැත්වූහ.

### 1.2.8.13. අලෙවි ප්‍රවර්ධන දිනය = එම්පෝරියා 2=කේ.18

කර්මාන්ත තොරතුරු තාක්ෂණවේද උපාධි වැඩසටහනේ දෙවන වසර උපාධි අපේක්ෂක අපේක්ෂිකාවෝ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අලෙවි සංකලනය පිළිබඳව ප්‍රායෝගික නිරාවරණය ලබා දෙනු පිණිස මෙම අවස්ථාව සංවිධානය කළහ. අලෙවි ප්‍රවර්ධන දිනය 2017 වර්ෂයේදී අධ්‍යයනාංශීය

වැඩසටහනක් ලෙස ආරම්භ කරන ලදී.එය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අලෙවි කළමනාකරණය පිළිබඳ සංකල්ප ඉගෙනීම පිණිස වේදිකාවක් ඇති කරයි.

**1.2.8.14. තේ දිනය = ඩෙස්ටිනෝ 2=කේ.18**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ තේ තාක්ෂණවේද හා අගය එක් කිරීම පිළිබඳ උපාධි වැඩසටහනේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 2018 දෙසැම්බර් 6 වන දින විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී 'තේ දිනය = ඩෙස්ටිනෝ 2-කේ. 18' සංවිධානය කළහ.මෙය ශ්‍රී ලංකාව තුළ තේ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමේ අභිප්‍රාය ඇතිව සංවිධානය කරන ලදී.

**1.2.9. ක්‍රීඩා ක්‍රියාකාරකම්**

**1.2.9.1. අයි.අයි.ටී. රග්බි සෙවන්ස් 2018**

කර්මාන්ත තොරතුරු තාක්ෂණවේද උපාධි වැඩසටහනේ උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් විසින් සංවිධානය කරන ලද අයි.අයි.ටී. රග්බි සෙවන්ස් නමැති අන්තර් විශ්වවිද්‍යාලීය රග්බි පාපන්දු තරගාවලිය 2018 පෙබරවාරි 17 වන දින ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය ක්‍රීඩාංගනයේදී සාර්ථකව පවත්වන ලදී.මෙම තරගාවලිය සබරගමුව විශ්වවිද්‍යාලයට, යාපනය විශ්වවිද්‍යාලයට, පාසල් කණ්ඩායම් 4 කට හා ඌව ක්‍රීඩා සමාජ රග්බි පාපන්දු කණ්ඩායම්වලට සිය කණ්ඩායම් හැඟීම ශක්තිමත් කර ගන්නා අතර සිය දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට කරළියක් ලබා දුන් අතර එහිදී සබරගමුව විශ්වවිද්‍යාලය ශූරයින් බවට පත් වූහ.

**1.2.9.2. ඒ.එන්.එස්. කුසලානය 2018 පාපන්දු තරගාවලිය**

සත්ව විද්‍යා උපාධි වැඩසටහනේ දෙවන වසර උපාධි අපේක්ෂක අපේක්ෂිකාවෝ ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර කණ්ඩායම් හැඟීම දිරිගන්වන අතර සිය දක්ෂතා ඔප්නංවා ගැනීමට සිය සහෝදර අධ්‍යයනාංශයන්හි ශිෂ්‍ය ශිෂ්‍යාවන් දිරිගන්වමින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ඒ.එන්.එස්. කුසලානය 2018 වාර්ෂික පාපන්දු තරගාවලිය 2018 ජූනි 12 වැනි දින 11 වරටත් සංවිධානය කළහ.

**1.2.9.3. සුහසාධක සංගමයේ ක්‍රිකට් තරගාවලිය හා පැදුරු සාදය 2018**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සුහසාධක සංගමය ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් සඳහා 2018 ජූනි 28 වන දින ක්‍රිකට් තරගාවලියක් හා සංස්කෘතික වැඩසටහනක් සඳහා සත්කාරකත්වය දැරීය. මෙම ක්‍රිකට් තරගාවලියට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සියලුම ප්‍රභේදවල කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් නියෝජනය කරන කණ්ඩායම් 11 ක් ඇතුළත් වූහ.එම වැඩසටහන අනතුරුව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය පවුලේ සංගීතමය රඟදැක්වීම් සහිත පැදුරු සාදය වෙත යොමු විය.

**1.2.9.4. අන්තර් විශ්වවිද්‍යාලීය දැල්පන්දු ශූරතාවය 2018**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන ඒකකය 2018 අගෝස්තු 18-19 දිනයන්හිදී 2018 අන්තර් විශ්වවිද්‍යාලීය දැල්පන්දු ශූරතාවය සංවිධානය කළ අතර විශ්වවිද්‍යාල 14 ක් නියෝජනය කරන උපාධි අපේක්ෂක අපේක්ෂිකාවෝ මෙම තරගාවලියට සහභාගි වූහ.ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ශූරතාවය දිනාගත් අවසාන මහා තරගය ඉතාමත් අපූර්ව තරගයක් වූ අතර කොළඹ විශ්වවිද්‍යාලය හා කැලණිය විශ්වවිද්‍යාලය පිළිවෙළින් ප්‍රථම අනුශූරතාව හා දෙව අනුශූරතාව දිනාගත්හ.

**1.2.9.5. ඊ.එන්.එම්. කුසලානය 2කේ.18**

ව්‍යවසායකත්ව හා කළමනාකරණ උපාධි වැඩසටහනේ උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් විසින් සංවිධානය කරන ලද ඊ.එන්.එම්. කුසලානය 2018 වාර්ෂික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලිය 2018 සැප්තැම්බර් 23-24 දිනයන්හිදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී.මෙම තරගාවලිය කණ්ඩායම් හැඟීම දිරිගැන්වීමේ අභිප්‍රාය ඇතිව, කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ගේ කණ්ඩායමක්ද ඇතුළුව කණ්ඩායම් 26 කගේ සහභාගිත්වයෙන් සාර්ථකව පවත්වන ලදී.2018

ඊ.එන්.එම්. කුසලානය කණ්ඩායම් දෙකක් විසින් = එනම් ඛනිජ සම්පත් හා තාක්ෂණවේදය සහ කර්මාන්ත තොරතුරු තාක්ෂණවේදය කණ්ඩායම් විසින් = දිනාගනු ලැබීය.

**1.2.9.6. රාජ්‍ය සේවා බැඩ්මින්ටන් ශූරතාවය 2018**

කොළඹ 7 ටොරිංටන්හි පිහිටි වෙළඳ සේවා බැඩ්මින්ටන් සංගම් පිටි තුළදී මෙම රාජ්‍ය සේවා බැඩ්මින්ටන් ශූරතා තරගාවලිය පවත්වන ලදී. ශ්‍රී ලංකා රේගුව සමග තරග වදිමින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය කණ්ඩායම 'ඒ ' කොටසේ කාන්තා අනුශූරතාව දිනාගත්හ.තවද, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන ඒකකයේ අධ්‍යක්ෂ ඩබ්ලියු.එම්.යූ.එන්. කීර්තිරත්න මිය අවසන් මහා තරගයේදී ශ්‍රී ලංකා පොලිසියේ ක්‍රීඩිකාව සමග තරග කොට කාන්තා කේවල අංශයේ රන් පදක්කම දිනා ගත්තාය.

**1.2.9.7. ඊ.ඒ.ජී. බැෂ් 2018**

2018 වර්ෂයේ ඊ.ඒ.ජී. බැෂ් ඉසව්ව 2018 දෙසැම්බර් 1 වන දින පවත්වන ලදී.පිරිමි හා කාන්තා ප්‍රභේද යටතේ වූ ශූරතාවන් පිළිවෙළින් අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශය හා ඉංජිනේරු තාක්ෂණවේද පීඨ කණ්ඩායම් විසින් දිනා ගන්නා ලදී.

**1.2.9.8. සී.එස්.ටී. ලෑන් චැලෙන්ජ් 2018**

| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දේ | 21,322ල757 | 41,230,251 |
| කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන දේ | 15,496,954 | 21,322,757 |

| | | |
|---|---|---|
| සටහන = 2018 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂ | | |
| බැංකුවගිණුම් අංකය | | |
| ලංකා බැංකුව | - 3114828 | 494,315 |
| ලංකා බැංකුව | - 3114820 | 522,669 |
| ලංකා බැංකුව | - 78166821 | 2,544,593 |
| ලංකා බැංකුව | - 78057047 | 5,466,430 |
| ලංකා බැංකුව | - 81216727 | 99,196 |
| මහජන බැංකුව | -10100168384805 | 6,369,752 |
| **එකතුව** | | 15,496,954 |

## 6.5. 2017.12.31 දිනට ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| | සම්චිත අරමුදල | පොදු සංචිතය | විශේෂ සංචිතය | විශේෂ අරමුදල් | | | | | එකතුව (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | යූ.කේ.කේ. අරමුදල | උපකුලපති අරමුදල | සංවර්ධන හා වෙනත් අරමුදල් | බැඳුම්කර උල්ලංඝණ අරමුදල | උපකුලපති ශිෂ්‍යත්ව අරමුදල | |
| | | | | | | | | | |
| 2017.01.01 දිනට ශේෂය | 2,147,937,123 | (610,077,413) | 7,399,112 | 3,345,738 | 393,865 | 177,364 | 25,084,128 | 1,092,719 | 1,575,352,637 |
| පෙර වර්ෂයේ ගැලපුම් | | | | | | | | | |
| පරිභෝජනීය තොග ආශ්‍රිත ගැලපුම් | | 316,473 | | | | | | | 316,473 |
| විශේෂ අවස්ථා සඳහා අරමුදල් පැවරුම | | 1,894,530 | | | | | | | 1,894,530 |
| උපචිත වියදම් ආශ්‍රිත ගැලපුම් | | 3,935,390 | | | | | | | 3,935,390 |
| වෙනත් | | (742,499) | | | | | | | (742,499) |
| 2017 ගනුදෙනු | | | | | | | | | |
| වර්ෂය සඳහා ප්‍රාග්ධන දායකත්වය හෝ එකතු කිරීම | 13,171,976 | | | 323,809 | 73,303 | 466,131 | 3,583,684 | 100,170 | 17,719,073 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය / (ඌණතාව) | | (85,587,906) | | | | | | | (85,587,906) |
| වර්ෂය තුළ ගෙවීම් | | | | | | | - | (66,000) | (66,000) |
| ලැබුණු පරිත්‍යාග/ ප්‍රදාන | | | 2,975,990 | | | | | | 2,975,990 |
| ප්‍රදානය ක්‍රමක්ෂය කිරීම | | | (1,194,372) | | | | | | 1,194,372* |
| 2017.12.31 දිනට ශේෂය | 2,161,109,100 | 690,261,424) | 9,180,730 | 3,669,547 | 467,168 | 643,495 | 28,667,813 | 1,126,889 | 1,514,603,318 |
| | | | | | | | | | |
| 2018.01.01 දිනට ශේෂය | 2,161,109,100 | (690,261,424) | 9,180,730 | 3,669,547 | 467,168 | 643,495 | 28,667,813 | 1,126,889 | 1,514,603,318 |

| | සම්චිත අරමුදල | පොදු සංචිතය | විශේෂ සංචිතය | විශේෂ අරමුදල් | | | | | එකතුව (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | යූ.කේ.කේ. අරමුදල | උපකුලපති අරමුදල | සංවර්ධන හා වෙනත් අරමුදල් | බැඳුම්කර උල්ලංඝණ අරමුදල | උපකුලපති ශිෂ්‍යත්ව අරමුදල | |
| | | | | | | | | | :167,439* |
| 2018 විද්වත් සමුළුව සඳහා ලද අනුග්‍රාහකත්ව | | (3,024,885) | | | | | | | :3,024,885* |
| උපචිත වියදම් ආශ්‍රිත ගැලපුම් | | 804,888 | | | | | | | 804,888 |
| වෙනත් | | (1,199,157) | | | | | | | :1,199,157* |
| 2018 ගනුදෙනු | | | | | | | | | |
| වර්ෂය සඳහා ප්‍රාග්ධන දායකත්වය හෝ එකතු කිරීම | 34,478,449 | | | 375,900 | 46,864 | 76,495 | 3,313,747 | 126,760 | 38,418,215 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය / (ඌණතාව) | | (168,999,621) | | | | | | | :168,999,621* |
| කාලපරිච්ඡේදය තුළ ගෙවීම් | | | | | | | | :70,000* | :70,000* |
| ලැබුණු පරිත්‍යාග/ ප්‍රදාන | | | 8,421,679 | | | | | | 8,421,679 |
| ප්‍රදානය ක්‍රමක්ෂය කිරීම | | | (8,063,578) | | | | | | :8,063,578* |
| 2018.12.31 දිනට ශේෂය | 2,195,587,549 | (862,847,638) | 9,538,832 | 4,045,447 | 514,032 | 719,990 | 31,981,560 | 1,183,649 | 1,380,723,421 |

## 6.6 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 6.6.1. පොදු

#### 6.6.1.1. පොදුගිණුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කිරීමේ ආකෘතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 03/2011 දරන චක්‍රලේඛ ලිපියට අනුකූල වෙයි. මූල්‍ය ප්‍රකාශයන් පිළියෙළ කෙරෙනුයේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව හා ඓතිහාසික පිරිවැය පිලිවෙත අනුගමනය කරමිනි. එහි උචිත තැන්හිදී පසු සටහන් තුළ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කෙරේ.

#### 6.6.1.2. සන්සන්දනාත්මක අගයන්

සන්සන්දනාත්මක සංඛ්‍යා අගයන් වත්මන් මූල්‍ය වර්ෂයේ ඉදිරිපත් කිරීමෙහි වෙනස්කම්වලට අනුකූල වන සේ ගැලපුම් කර ඇත.

### 6.6.2. දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ පිරිවැය මත හෝ තක්සේරුවෙන් සමුච්චිත ක්ෂය අඩු කොට සඳහන් කරනු ලැබේ. ප්‍රදානයන් වශයෙන් ලැබුණු ස්ථාවර වත්කම් පිරිවැයට ගිණුම්ගත කරන ලද අතර ඒවායේ ක්ෂය අදාළ සංචිත ගිණුමට පවරනු ලැබේ. අත්කරගත් මාසයේ සිට බැහැර කරන ලද මාසය දක්වා පහත අනුපාතිකවලින් සරල රේඛීය පදනමින් ක්ෂය ගණනය කෙරේ:-

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | 20% |
| පුස්තකාල ග්‍රන්ථ | 20% |
| ලෝගු | 20% |
| වයිරස් ආරක්ෂක | 33 1/3 % |
| අස්පෘශ්‍ය වත්කම් | 20% |
| මෝටර් වාහන | 20% |

ගුණාත්මකතා වැඩිදියුණු කිරීම් ව්‍යාපෘති ඒවායේ ප්‍රයෝජනවත් ආයුකාලය මත පදනම්ව ක්‍රමක්ෂය කරනු ලැබේ.

#### 6.6.2.1. පරිලේඛන

පරිභෝජනද්‍රව්‍ය පරිලේඛනයන්හි දක්වනු ලබන්නේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් පහළ අගයෙන් ය. පරිලේඛනයන්හි පිරිවැය තක්සේරු කරනු ලබන්නේ පළමුව ඇතුළු වැන්න පළමුව පිටතට (ෂෆඩ) පදනමිනි.

**2.2. අයවිය යුතු දේ**

අයවිය යුතු දේ ඇස්තමේන්තුගත උපලබ්ධි අගයෙන් සඳහන් කරනු ලැබේ.

**3. සමුච්චිත අරමුදල**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ස්ථාපිත කරනු පිණිස මූලික ප්‍රාග්ධනයක් වශයෙන් ශ්‍රී ලංකා රජය විසින් ප්‍රදානය කරන ලද මුදල ප්‍රාග්ධනප්‍රදාන ගිණුමෙන් සමුච්චිත අරමුදල් ගිණුමට පවරන ලදී.

**4. ප්‍රදානය සඳහා ගිණුම්කරණය**

**4.1. රජයේ ප්‍රදාන**

ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම ආශ්‍රිත ප්‍රදානයන් විලම්බිත ආදායම වශයෙන් සලකනු ලබන අතර, එය අනතුරුව අදාළ වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය මුළුල්ලේ ආදායම් හා වියදම් ගිණුම වෙත බැර කරනු ලැබේ. විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීමට සම්බන්ධ ප්‍රාග්ධන ප්‍රදානයන් සමුච්චිත ගිණුමට බැර කෙරේ. පුනරාවර්තන ප්‍රදානයන් පුනරාවර්තන ආදායම ලෙස ආදායම් හා වියදම් ගිණුමට බැර කරනු ලැබේ.

වර්ෂය අවසානයේ වැය නොකළ ස්වරූපයෙන් වූ ප්‍රාග්ධන ප්‍රදානයන්හි පවතින ශේෂය ''වැය නොකළ ප්‍රදාන -ප්‍රාග්ධන'' ලෙස අනාවරණය කර ඇත.

**4.2. වෙනත් ප්‍රදානයන්**

වෙනත් ප්‍රදානයන් මගින් කාලපරිච්ඡේදය තුළ රජය හැර වෙනත් මූලාශ්‍ර වෙතින් ලැබුණු සියලුම ප්‍රදානයන් නියෝජනය කෙරේ.

ගිණුම් තුළ එබඳු ප්‍රදානයන් ගිණුම් තුළ ක්‍රමක්ෂය කිරීම සිදුකරනු ලබන්නේ අදාළ කාලපරිච්ඡේදය තුළ එම වත්කම්වල ක්ෂයට සමාන මුදලක් ආදායමක් වශයෙන් සලකමිනි.

**5. බැරකම් හා ප්‍රතිපාදන**

**5.1 විශ්‍රාම ප්‍රතිලාභ**

1983 අංක 12 දරන පාරිතෝෂික පනත ප්‍රකාරව, සේවකයකු වෙත වූ බැරකම වර්ෂ 5 ක අඛණ්ඩ සේවාකාලයක් සම්පූර්ණ කිරීමත් සමග පැනනගී. මෙම බැරකම සපුරාලනු පිණිස වර්ෂ 5 ක සේවාකාලයක් සම්පූර්ණ කර ඇති සෑම සේවකයකු වෙනුවෙන්ම මූල්‍ය වර්ෂයේ අවසාන මාසයේ වැටුප පදනම්ව, අඩ මසක වැටුපට සමාන මුදලක් ප්‍රතිපාදනය කෙරේ. ස්ථාන මාරු කරන ලද සේවකයින්ගේ පාරිතෝෂික ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළ ගලපන ලදී.

**6. ආදායම සහ වියදම**

**6.1 ආදායම හඳුනා ගැනීම**

මහා භාණ්ඩාගාර ප්‍රදානයන් මුදල් පදනමින් හඳුනා ගැනෙන අතර වෙනත් ආදායම් හඳුනා ගනු ලබන්නේ උපචිත පදනමිනි.

**6.2 වියදම් හඳුනා ගැනීම**

විශ්වවිද්‍යාලය පවත්වා ගෙන යාමේදී ඇති වූ සියලූ වියදම් උපචිත පදනමින් හඳුනා ගෙන ඇති අතර, වියදමට සාපේක්ෂව ආදායම නිශ්චය කර ගැනීමෙහිදී ආදායමට ආරෝපනය කරනු ලැබේ.

**6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය භාවිතා කරමින් පිළියෙළ කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරණා සඳහා, මුදල් හා මුදල් සමාන දේ බැංකුවල දරනු ලබන ජංගම ගිණුම් ශේෂයන්ගෙන් සමන්විත වේ.

**7. විදේශ මුදල් ගනුදෙනු**

විදේශ මුදල් ගනුදෙනු එය සිදුවන අවස්ථාවේ පවතින විදේශ විනිමය අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට හරවනු ලැබේ.

## 6.7 මූල්‍ය ප්‍රකාශන සටහන්

| 6.7. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශවලට සටහන් | | | |
|---|---|---|---|
| | | | |
| 01 | මුදල් හා මුදල් සමාන දේ | | |
| | බැංකු ශේෂ | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | ලංකා බැංකුව - බදුල්ල | | |
| | ගිණුම් අංක 3114820 | 522,669 | 7,770,475 |
| | ගිණුම් අංක 3114828 | 494,315 | 1,642,414 |
| | ගිණුම් අංක 78166821 | 2,544,593 | 2,302,435 |
| | ගිණුම් අංක 78057047 | 5,466,430 | 4,517,684 |
| | ගිණුම් අංක 81216727 | 99,196 | 623,105 |
| | මහජන බැංකුව - බදුල්ල | | |
| | ගිණුම් අංක 010100168384805 | 6,369,752 | 4,466,644 |
| | | 15,496,954 | 21,322,757 |
| | | | |
| 02 | ආයෝජන | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | ස්ථිර තැන්පතු | | |
| | යූ.කේ.කේ. අරමුදල - මහජන බැංකුව | 3,684,491 | 3,319,362 |
| | උපකුලපති අරමුදල - ලංකා බැංකුව | 299,956 | 248,696 |
| | ඇප තැන්පතු (ෂරප් හා ගබඩා භාරකරු) - ලංකා බැංකුව | 75,000 | 75,000 |
| | බැඳුම්කර උල්ලංඝණ අරමුදල | 17,747,571 | 17,138,019 |
| | උපකුලපති ශිෂ්‍යත්ව අරමුදල | 1,175,865 | 1,069,941 |
| | කෙටි පාඨමාලා අරමුදල | - | 1,500,000 |
| | උපාධි ප්‍රදානෝත්සව සම්මාන සඳහා අරමුදල් | 204,600 | 150,000 |
| | සිංහරාජ ව්‍යාපෘතිය | 5,090,154 | - |
| | | 28,277,637 | 23,501,018 |
| | | | |
| 03 | අයවිය යුතු දේ | | |
| | | 2018 | 2017 |

| | | | | |
|---|---|---|---|---|
| | | | රුපියල් | රුපියල් |
| | ඇප තැන්පතු | | 200,000 | 200,000 |
| | අයවිය යුතු දේපුනරාවර්තන | | 19,615,239 | 20,117,319 |
| | අයවිය යුතු දේ ස්වයං-මූල්‍ය සම්පාදිත වැඩසටහන් | | 10,000 | 1,054,977 |
| | වාහන ණය | | 251,338 | 209,665 |
| | කාර්ය මණ්ඩල ණය | | 6,120 | 5,100 |
| | උත්සව අත්තිකාරම් | | 124,500 | 173,250 |
| | පරිගණක ණය | | 105,500 | 46,000 |
| | ආපදා ණය | | 3,566,430 | 2,894,898 |
| | විශේෂ අත්තිකාරම් | | 400 | - |
| | ගංවතුර සහන අත්තිකාරම් | | 106,108 | - |
| | | | 23,985,635 | 24,701,209 |
| | | | | |
| 04 | පරිලේඛන | | | |
| | | | 2018 | 2017 |
| | | | රුපියල් | රුපියල් |
| | ලිපිද්‍රව්‍ය | | 6,662,819 | 6,161,546 |
| | ගොඩනැගිලි හා ව්‍යුහ නඩත්තුව | | 1,176,070 | 1,041,037 |
| | යාන්ත්‍රික හා විදුලි භාණ්ඩ | | 400,183 | 914,139 |
| | වෛද්‍ය සැපයුම් | 4.1 | 756,171 | 311,274 |
| | රසායන ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩ | 4.1 | 23,782,696 | 23,562,128 |
| | | | 32,777,938 | 31,990,125 |
| | | | | |
| | | | | |
| 4෴1 | වෛද්‍ය සැපයුම්, රසායන ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩ | | | |
| | | | වෛද්‍ය තොගය | රසායන ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩ |
| | ආරම්භක තොගයේ වටිණාකම | | 311,274 | 23,562,128 |
| | මිලදී ගැනීම් | | 1,483,808 | 8,903,798 |
| | සමාප්ති තොගයේ වටිණාකම | | (756,171) | (23,782,696) |
| | 2018 වර්ෂය සඳහා පරිභෝජනය | | 1,038,911 | 8,683,230 |
| | | | | |
| 4෴2 | ප්‍රායෝගික කාර්යයන් සඳහා මිලට ගනු ලැබූ පහත සඳහන් සත්ව වර්ග එම සංඛ්‍යාවලින් 2018දෙසැම්බර් 31 දින වන විට විශ්වවිද්‍යාලය තුළ වාසය කළහ. | | | |
| | | | සංඛ්‍යාව | |
| | හාවෝ | | 2 | |
| | එළුවෝ | | 3 | |
| | කළුකුමෝ | | 1 | |
| | | | | |
| | | | | |
| 05 | අත්තිකාරම් | | | |
| | | | 2018 | 2017 |

| | | | | |
|---|---|---|---|---|
| | | | රුපියල් | රුපියල් |
| | විවිධ අත්තිකාරම් - පුනරාවර්තන | | 15,200 | 15,001 |
| | විවිධ අත්තිකාරම් - ප්‍රාග්ධන | | 954,567 | 145,304 |
| | | | 969,767 | 160,305 |
| | | | | |
| | | | | |
| 06 | අයවිය යුතු දේ - ජංගම නොවන වත්කම් | | | |
| | | | 2018 | 2017 |
| | | | රුපියල් | රුපියල් |
| | වාහන ණය | | 556,133 | 369,821 |
| | කාර්ය මණ්ඩල ණය | | 10,030 | 9,690 |
| | පරිගණක ණය | | 266,500 | 133,500 |
| | ආපදා ණය | | 8,744,717 | 8,510,303 |
| | | | 9,577,381 | 9,023,315 |
| | | | | |
| | | | | |
| 11 | උපචිත වියදම් | | | |
| | | | 2018 | 2017 |
| | | | රුපියල් | රුපියල් |
| | පුනරාවර්තන ගෙවීම් | | 66,630,653 | 21,036,336 |
| | ස්වයං-මූල්‍ය සම්පාදිත වැඩසටහන් | | 620,432 | 1,640,169 |
| | | | 67,251,085 | 22,676,504 |
| | | | | |
| | | | | |
| 12 | විවිධ ණයහිමියෝ හා වෙනත් අය | | | |
| | | | 2018 | 2017 |
| | | | රුපියල් | රුපියල් |
| | රඳවා ගත් මුදල් | 12ශ1 | 66,822,249 | 53,515,250 |
| | විවිධ ණය හිමියෝ - පුනරාවර්තන | | 10,567,159 | 5,191,030 |
| | විවිධ ණය හිමියෝ - ප්‍රාග්ධන | | 41,663,455 | 56,380,820 |
| | ඇප තැන්පතු මත ගෙවිය යුතු පොළිය | | 20,881 | 6,713 |
| | ආපසු ගෙවිය යුතු තැන්පතු | | 859,307 | 1,020,817 |
| | ඇප තැන්පතු - පුනරාවර්තන | | 1,484,811 | 800,000 |
| | තැන්පත් කරන ලද හා ගෙවිය යුතු - පුනරාවර්තන | | 609,807 | 261,147 |
| | තැන්පත් කරන ලද හා ගෙවිය යුතු - ප්‍රාග්ධන | | - | 49,190 |
| | තැන්පත් කරන ලද හා ගෙවිය යුතු - ස්වයං-මූල්‍ය සම්පාදිත වැඩසටහන | | 617,119 | 617,119 |
| | ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු | | 88,650 | 16,950 |
| | ගෙවිය යුතු මුද්දර බදු | | 41,000 | 36,825 |
| | ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු | | 1,325,498 | - |
| | | | 124,099,936 | 117,895,861 |
| | | | | |
| 12ශ1 | රඳවා ගත් මුදල් | | | |

| | සැපයුම්කරු/භාණ්ඩය | 2018.01.01 දිනට ශේෂය | එකතු කිරීම්/ ගැලපුම් | මුදාහරින ලද | 2018.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| 12.1.1 | ඉදිකිරීම් | 17,436,179 | 14,625,950 | - | 32,062,129 |
| 12.1.2 | ගෘහභාණ්ඩ | 3,867,727 | 3,703,818 | 264,026 | 7,307,518 |
| 12.1.3 | පරිගණක | 182,009 | 1,016,149 | - | 1,198,157 |
| 12.1.4 | කාර්යාලීය උපකරණ | 189,640 | 77,050 | - | 266,690 |
| 12.1.5 | විද්‍යාගාර උපකරණ | 10,161,876 | 10,655,065 | - | 20,816,942 |
| 12.1.6 | තාක්ෂණවේද විෂය ධාරාව | 3,464,073 | 508,543 | 1,888,801 | 2,083,815 |
| 12.1.7 | වෙනත් ප්‍රාග්ධන වත්කම් | - | 546,122 | - | 546,122 |
| 12.1.8 | ගොඩනැගිලි හා ව්‍යූහ - පුනරුත්ථාපනය | 709,365 | 1,942,845 | 111,335 | 2,540,875 |
| | | 36,010,868 | 33,075,543 | 2,264,162 | 66,822,249 |

| | | | |
|---|---|---|---|
| 13 | විලම්බිත ආදායම | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | 2018/01/01 දිනට ගලපන ලද ශේෂය | 640,059,881 | 288,919,570 |
| | වර්ෂය සඳහා ප්‍රාග්ධන දායකත්වය | 386,669,650 | 455,648,259 |
| | ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | (137,062,279) | (104,507,949) |
| | | 889,667,252 | 640,059,881 |

| | | | |
|---|---|---|---|
| 14 | පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | 2018.01.01 දිනට ශේෂය | 22,019,360 | 15,183,378 |
| | ගැලපුම් | - | (386,585) |
| | ගැලපුම් කරන ලද ශේෂය | 22,019,360 | 14,796,794 |
| | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදනය | 9,947,574 | 7,222,566 |
| | 2018.12.31 දිනට ශේෂය | 31,966,934 | 22,019,360 |

| | | | |
|---|---|---|---|
| 15 | සමුච්චිත අරමුදල | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | 2018.01.01 දිනට ශේෂය | 2,161,109,100 | 2,147,937,123 |
| | වර්ෂය සඳහා ප්‍රාග්ධන දායකත්වය | 34,478,449 | 13,171,976 |
| | 2018.12.31 දිනට ශේෂය | 2,195,587,549 | 2,161,109,100 |
| 16 | පොදු සංචිත | | |

| | | 2018 | 2017 |
|---|---|---|---|
| | | රුපියල් | රුපියල් |
| | 2018.01.01 දිනට ශේෂය | (690,261,424) | (610,077,413) |
| | පෙර කාලපරිච්ඡේදවලට අදාළ ගැලපුම් | - | - |
| | පරිභෝජනීය තොගය ආශ්‍රිත ගැලපුම් | (167,439) | 316,473 |
| | විශේෂ අවස්ථා සඳහා අරමුදල් පැවරුම | - | 1,894,530 |
| | උපචිත වියදම් ආශ්‍රිත ගැලපුම් | 804,888 | 3,935,390 |
| | විද්වත් සමුළුව සඳහා ලැබුණු අනුග්‍රාහකත්ව -2018 | (3,024,885) | - |
| | වෙනත් | (1,199,157) | (742,499) |
| | ගලපන ලද ශේෂය | (693,848,017) | (604,673,519) |
| | පවරන ලද අතිරික්තය / (ඌණතාව) | (168,999,621) | (85,587,906) |
| | 2018.12.31 දිනට ශේෂය | (862,847,638) | (690,261,424) |
| | | | |
| | | | |
| 17 | විශේෂ සංචිතය | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | 2018.01.01 දිනට ශේෂය | 9,180,730 | 7,399,112 |
| | වෙනත් ප්‍රදානයන් වෙතින් ලැබූ වත්කම් | 8,421,679 | 2,975,990 |
| | ප්‍රදානයන් ක්‍රමක්ෂය | (8,063,578) | (1,194,372) |
| | | 9,538,832 | 9,180,730 |
| | | | |
| 18 | විශේෂ අරමුදල් | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | යූ.කේ.කේ. අරමුදල | 4,045,447 | 3,669,547 |
| | උපකුලපති අරමුදල | 514,032 | 467,168 |
| | සුභසාධක අරමුදල | 177,364 | 177,364 |
| | බැඳුම්කර උල්ලංඝණ අරමුදල | 31,981,560 | 28,667,813 |
| | කුලපති ශිෂ්‍යත්ව අරමුදල | 1,183,649 | 1,126,889 |
| | විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල | 202,165 | 202,165 |
| | සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨ සංවර්ධන අරමුදල | 6,392 | 6,392 |
| | විද්‍යා හා තාක්ෂණවේද පීඨ සංවර්ධන අරමුදල | 107,611 | 92,911 |
| | කළමනාකරණ පීඨ සංවර්ධන අරමුදල | 6,884 | 6,884 |
| | සී.ඕ.බී.එල්. සංවර්ධන අරමුදල | 5,000 | 5,000 |
| | සම්මාන සඳහා වූ අරමුදල | 214,574 | 152,779 |
| | | 38,444,678 | 34,574,912 |
| | | | |
| | | | |
| 19 | පුනරාවර්තන ප්‍රදාන | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |

| | | | |
|---|---|---|---|
| | මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු පුනරාවර්තන ප්‍රදාන | 700,000,000 | 614,950,000 |
| | | 700,000,000 | 614,950,000 |
| | | | |
| 20 | ශිෂ්‍යාධාර හා මහපොළ ප්‍රදාන | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | ශිෂ්‍යාධාර | 22,847,700 | 21,501,900 |
| | මහපොළ භාර අරමුදල | 17,172,200 | 20,028,250 |
| | මහපොල - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දායකත්වය | 16,430,300 | 19,075,800 |
| | | 56,450,200 | 60,605,950 |
| 21 | ස්වයං-මූල්‍ය සම්පාදිත වැඩසටහනේ ආදායම | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | පාඨමාලා ගාස්තු - සහතික පත්‍ර පාඨමාලා | 3,207,500 | 2,510,989 |
| | උපදේශකත්ව ගාස්තු | 291,877 | 2,354,773 |
| | | 3,499,377 | 4,865,762 |
| | | | |
| 22 | වෙනත් ආදායම් | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | ලියාපදිංචි කිරීමේ ගාස්තු - උපාධි අපේක්ෂක අපේක්ෂිකා | 754,000 | 759,850 |
| | විභාග ගාස්තු - උපාධි අපේක්ෂක අපේක්ෂිකා | 792,615 | 818,182 |
| | ණය හා අත්තිකාරම්වලින් පොළිය | 527,494 | 375,292 |
| | ආයෝජනවලින් පොළිය | 1,509,488 | 347,021 |
| | ඉවත දමන ලද භාණ්ඩ විකිණීම | 96,096 | 36,564 |
| | නිෂ්පාදන විකිණීම | 5,395 | - |
| | කුලී ආදායම | 274,598 | 742,476 |
| | නේවාසිකාගාර ගාස්තු | 4,964,711 | 4,143,151 |
| | වෛද්‍ය ගාස්තු | 152,700 | 153,500 |
| | පුස්තකාල දඩ | 59,946 | 34,620 |
| | අනුපූරක ක්‍රියාකාරකම් | 680,300 | 489,700 |
| | විවිධ ලැබීම් - පුනරාවර්තන | 3,367,696 | 2,693,613 |
| | විවිධ ලැබීම් - ප්‍රාග්ධන | 1,496,461 | 3,294,699 |
| | පොළී ආදායම - ස්වයං-මූල්‍ය සම්පාදිත වැඩසටහන් | 20,319 | 193,321 |
| | අභියෝග්‍යතා පරීක්ෂණය (වියදම = යොමු සටහන 29) | 4,114,400 | 3,565,900 |
| | විද්වත් සමුළුවේ ආදායම (වියදම = යොමු සටහන 29) | - | 6,606,178 |
| | | 18,816,217 | 24,254,066 |
| | | | |
| 23 | වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | රජයේ ප්‍රාග්ධන ප්‍රදානය ක්‍රමක්ෂය කිරීම | 137,062,279 | 104,507,949 |
| | වෙනත් ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම (පරිත්‍යාග) | 8,063,578 | 1,188,360 |

| | | | |
|---|---|---|---|
| | පරිත්‍යාග ක්‍රමක්ෂය කිරීම (පුස්තකාල ග්‍රන්ථ) | - | 6,012 |
| | | 145,125,857 | 105,702,321 |
| | | | |
| 24 | පුද්ගල පඩිනඩි | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | පුද්ගල පඩිනඩි - අධ්‍යයන කාර්ය මණ්ඩලය | 354,565,436 | 267,383,227 |
| | පුද්ගල පඩිනඩි - අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 129,069,257 | 80,250,883 |
| | එකතුව (අධ්‍යයන හා අනධ්‍යයන) | 483,634,692 | 347,634,110 |
| | | | |
| | | | |
| 25 | ගමන් හා යැපුම් | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | දේශීය | 1,009,194 | 552,658 |
| | විදේශීය | 5,422,884 | 3,453,860 |
| | | 6,432,078 | 4,006,517 |
| | | | |
| 26 | සැපයුම් | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍ය ද්‍රව්‍ය | 9,045,366 | 4,406,441 |
| | ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය - ප්‍රවාහන | 2,009,614 | 1,067,291 |
| | තිලඇඳුම් හා ඇඳුම් මැසීමේ ගාස්තු | 368,114 | 20,700 |
| | යාන්ත්‍රික හා විදුලි භාණ්ඩ | 1,786,790 | 2,443,444 |
| | රසායන ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩ | 8,683,230 | 24,948,032 |
| | වෛද්‍ය සැපයුම් | 1,038,911 | 917,936 |
| | වෙනත් සැපයුම් | 737,684 | 217,370 |
| | | 23,669,710 | 34,021,213 |
| | | | |
| | | | |
| 27 | නඩත්තුව | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | වාහන | 764,292 | 333,728 |
| | පිරියත, යන්ත්‍ර හා උපකරණ | 1,161,975 | 1,045,346 |
| | ගොඩනැගිලි හා ව්‍යුහ | 10,041,732 | 14,349,916 |
| | ගෘහභාණ්ඩ | 7,000 | 144,250 |
| | වෙනත් නඩත්තු වැඩ | 113,598 | 192,160 |
| | | 12,088,597 | 16,065,401 |
| | | | |
| 28 | කොන්ත්‍රාත්තු සේවා | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | ප්‍රවාහනය | 27,123,919 | 20,144,227 |

| | | | |
|---|---|---|---|
| | විදුත් සන්නිවේදන | 12,202,221 | 11,747,664 |
| | තැපැල් ගාස්තු | 562,345 | 687,665 |
| | විදුලිය | 16,182,731 | 14,646,957 |
| | ජලය | 6,158,602 | 5,647,927 |
| | ආරක්ෂක සේවාව | 42,116,403 | 40,922,296 |
| | පිරිසිදු කිරීමේ සේවාව | 55,246,178 | 35,325,754 |
| | කුලී ගාස්තු | 34,181,341 | 25,488,115 |
| | මුද්‍රණය හා ප්‍රචාරණය ආදිය | 7,347,178 | 7,398,378 |
| | වෙනත් ගිවිසුම්ගත සේවා | 4,383,747 | 2,988,717 |
| | | 205,504,666 | 164,997,699 |
| | | | |
| 29 | වෙනත් පුනරාවර්තන වියදම් | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා ගමන් ප්‍රදාන | 451,850 | 510,170 |
| | විශේෂ සේවා - පාලක සභාව හා කමිටු | 1,400,307 | 1,085,305 |
| | විශේෂ සේවා - වෘත්තීයවේදීන් හා වෙනත් | 3,771,846 | 3,690,262 |
| | වැඩමුළු, සම්මන්ත්‍රණ ආදිය | 2,247,308 | 952,848 |
| | අධ්‍යයන පර්යේෂණ | 809,831 | 556,946 |
| | කාර්ය මණ්ඩල සංවර්ධනය | 3,445,761 | 2,049,963 |
| | පශ්චාත් උපාධි පර්යේෂණ සහ ශිෂ්‍යත්ව | 1,275,396 | 3,564,746 |
| | ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පාඨමාලා ද්‍රව්‍ය හා ගුණාත්මකතා වර්ධනය | 1,036,834 | 447,674 |
| | කර්මාන්ත සීමාවාසිකත්වයන්, ප්‍රායෝගික හා වෘත්තීය මාර්ගෝපදේශනය | 1,028,399 | 1,774,231 |
| | ශිෂ්‍ය සංවර්ධන හා මූලිකත්ව වැඩසටහන් | 6,682,293 | 9,249,944 |
| | විශ්වවිද්‍යාලීය ක්‍රීඩා ක්‍රියාකාරකම් | 7,224,253 | 8,718,689 |
| | ශිෂ්‍ය හා සේවක සුභසාධනය | 257,474 | 318,850 |
| | සංස්ථායික සැලැස්ම හා වර්ධන දසුන | 178,022 | - |
| | නිවාඩු ගමන් බලපත්‍ර හා වාර ප්‍රවේශපත්‍ර | 311,506 | 139,297 |
| | සංග්‍රහ වියදම් | 393,108 | 472,347 |
| | බැංකු ගාස්තු | 6,000 | 5,542 |
| | තීරක ප්‍රදාන හා හානිරක්ෂණ | - | - |
| | දායකත්ව හා සාමාජිකත්ව ගාස්තු | 582,617 | 776,289 |
| | උපාධි ප්‍රදානෝත්සව වියදම් | 3,345,211 | 2,976,584 |
| | විභාග වියදම් | 9,509,023 | 12,039,567 |
| | වෙනත් | 1,090,710 | 531,319 |
| | අභියෝග්‍යතා පරීක්ෂණයේ වියදම් (වියදම = යොමු සටහන 22) | 3,676,729 | 3,064,226 |
| | සේවක සුභසාධන හා වෛද්‍ය | 163,432 | 153,163 |
| | විද්වත් සමුළුවේ වියදම් (වියදම = යොමු සටහන 22) | - | 5,432,986 |
| | | 48,887,910 | 58,510,947 |
| | | | |
| 30 | ස්වයං-මූල්‍ය සම්පාදිත වැඩසටහනේ වියදම් | | |
| | | 2018 | 2017 |

| | | | |
|---|---|---|---|
| | | රුපියල් | රුපියල් |
| | සම්පත්දායක ගාස්තු | 265,700 | 189,000 |
| | ලිපිද්‍රව්‍ය හා පරිභෝජනීය ද්‍රව්‍ය | 183,454 | 455,904 |
| | ආරාධිත දේශන ගාස්තු | 712,300 | 906,625 |
| | සම්බන්ධීකරණ ගාස්තු | 241,698 | 328,266 |
| | ප්‍රචාරණය | 31,280 | 47,127 |
| | ගිවිසුම්ගත සේවා | 284,858 | 459,099 |
| | වෙනත් වියදම් | 439,113 | 90,173 |
| | විශ්වවිද්‍යාලීය පොදුකාර්ය වියදම් | - | 43,300 |
| | විභාග වියදම් | 120,040 | 114,150 |
| | | 2ල278ල443 | 2ල633ල643 |
| | | | |
| 31 | ශිෂ්‍යාධාර හා මහපොල ගෙවීම් | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | ශිෂ්‍යාධාර ශිෂ්‍යත්ව ගෙවීම් | 22,847,700 | 21,501,900 |
| | මහපොල ශිෂ්‍යත්ව ගෙවීම් | 33,602,500 | 39,104,050 |
| | | 56,450,200 | 60,605,950 |
| | | | |
| 32 | ක්ෂය | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | වත්කම් ක්ෂය | 243,098,106 | 196,300,451 |
| | අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | 10,846,871 | 11,190,072 |
| | එකතුව | 253,944,977 | 207,490,523 |
| | | | |
| | | | |
| 33 | පුනරාවර්තන වියදම | | |
| | වැඩසටහන් පාදක වියදම් | | |
| | | 2018 | 2017 |
| | | රුපියල් | රුපියල් |
| | පොදු පරිපාලනය | 271,479,322 | 183,064,189 |
| | අධ්‍යයන සේවා | 427,966,401 | 349,517,867 |
| | ඉගැන්වීම් සම්පත් | 17,218,691 | 10,543,754 |
| | නඩත්තුව | 25,869,136 | 10,958,051 |
| | සුභසාධන සේවා | 14,403,595 | 23,130,552 |
| | අනුපූරක ක්‍රියාකාරකම් | 23,280,508 | 48,021,477 |
| | | 780,217,653 | 625,235,890 |
| | | | |
| 34ග | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට එදිරිව කර්මාන්තකරුවකු විසින් පවරන ලද නඩු (රිට් අයදුම්පත්) තුනක් අධිකරණය ඉදිරියේ පවතී. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය එක් හවුල් වගඋත්තරකරුවෙක් වන අතර මේ දක්වා ඇස්තමේන්තුගත අලාභයක් හෝ ලාභයක් නොමැත. | | |

| | |
|---|---|
| 35ග | ඇඟළුම් කම්හලක් අත්කර ගැනීමෙහි අලෙවි ආදායම පියවීමේදී ඇති වූ ප්‍රමාදයක් හේතුවෙන් පොළියෙහි දඩමුදලක් ස්වරූපයෙන් වූ අවම වගකීමක් වන රුපියල් මිලියන 25 ක අසම්භාව්‍ය බැරකමක් ඇති වී තිබේ. මෙම බැරකම බදුල්ල ප්‍රාදේශීය ලේකම් සඳහා පවතී. |
| | |
| 36ග | නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙම විශ්වවිද්‍යාලය උසස් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීමේ සංවර්ධනය කිරීම කඩිනම් කිරීමේ ව්‍යාපෘතියේ (අහෙඩ් ව්‍යාපෘතියේ) ප්‍රදානලාභියකු වශයෙන් තෝරා ගෙන තිබේ.2018 වර්ෂය තුළ රුපියල් මිලියන 14.4 ක් වටිණා වත්කම් අත්කර ගෙන ඇති අතර විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ උසස් අධ්‍යාපනය සඳහා රුපියල් මිලියන 1.8 ක් වැය කර ඇත. |
| | |

## 6.8 වැඩසටහන් හා ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම් සාරාංශය

| වැඩසටහන | පුද්ගල පඩිනඩි - අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය | ගමන් වියදම් | සැපයුම් | නඩත්තු වියදම් | ගිවිසුම්ගත සේවා | වෙනත් පුනරාවර්තන වියදම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| පොදු පරිපාලනය | 80,045,879 | 2,911,589 | 8,406,488 | 10,880,957 | 152,980,213 | 16,254,196 | 271,479,322 |
| පොදු පරිපාලනය | 62,195,032 | 2,910,179 | 6,013,983 | 10,359,288 | 82,768,409 | 15,865,032 | 180,111,923 |
| මූල්‍ය පරිපාලනය | 15,475,672 | 1,410 | 305,361 | 37,835 | 917,637 | 367,226 | 17,105,141 |
| ගබඩා හා සැපයුම් සේවා | 1,318,821 | - | 215,160 | - | 209,419 | 21,938 | 1,765,338 |
| ආරක්ෂක සේවාය | 1,056,355 | - | 3,077 | - | 42,131,070 | - | 43,190,502 |
| ප්‍රවාහන සේවාව | - | - | 1,868,907 | 483,834 | 26,953,679 | - | 29,306,419 |
| | | | | | | | |
| අධ්‍යයන | 380,798,129 | 3,467,937 | 11,385,863 | 318,718 | 10,049,965 | 21,945,789 | 427,966,401 |
| විද්‍යා හා තාක්ෂණවේද පීඨය | 139,247,018 | 865,804 | 1,851,981 | 17,400 | 4,267,344 | 4,777,012 | 151,026,560 |
| කළමනාකරණ පීඨය | 65,724,004 | 1,758,568 | 1,178,496 | 36,195 | 1,543,206 | 6,117,241 | 76,357,711 |
| සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය | 156,863,694 | 657,917 | 7,404,694 | 180,273 | 3,982,309 | 9,974,867 | 179,063,754 |
| තාක්ෂණවේද අධ්‍යයන පීඨය | 18,963,413 | 185,647 | 950,692 | 84,850 | 257,106 | 1,076,669 | 21,518,376 |
| | | | | | | | |
| ඉගැන්වීම් සම්පත් | 12,342,529 | - | 1,183,642 | 16,100 | 381,590 | 3,294,830 | 17,218,691 |
| පුස්තකාල සේවා | 12,340,205 | - | 724,961 | 16,100 | 306,356 | 123,314 | 13,510,935 |
| අධ්‍යාපන තාක්ෂණවේද | 2,324 | - | 458,681 | - | 75,235 | 3,171,516 | 3,707,756 |
| | | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සුහසාධන සේවා | 5,076,308 | 52,553 | 1,571,849 | 16,300 | 293,490 | 7,393,095 | 14,403,595 |
| වැඩසටහන | පුද්ගල පඩිනඩි - අධ්‍යයන හා අනධ්‍යයන | ගමන් වියදම් | සැපයුම් | නඩත්තු වියදම් | ගිවිසුම්ගත සේවා | වෙනත් පුනරාවර්තන වියදම් | එකතුව |
| ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල සුහසාධනය | - | - | - | - | 10,581 | 189,013 | 199,594 |
| සෞඛ්‍ය සේවා | 3,212,843 | - | 1,421,033 | 16,300 | 51,986 | 5,406 | 4,707,567 |
| ශාරීරික අධ්‍යාපනය | 1,863,465 | 52,553 | 150,816 | - | 230,923 | 7,198,677 | 9,496,433 |
| | | | | | | | |
| නඩත්තුව | 1,550,770 | - | 1,119,546 | 856,522 | 22,342,298 | - | 25,869,136 |
| ඉඩම් හා ගොඩනැගිලි | 1,149,603 | - | 1,119,546 | 856,522 | 966 | - | 3,126,636 |
| විදුලි සැපයුම | 401,167 | - | - | - | 16,182,731 | - | 16,583,898 |
| ජල සැපයුම | - | - | - | - | 6,158,602 | - | 6,158,602 |
| | | | | | | | |
| අනුපූරක ක්‍රියාකාරකම් | 3821,076 | - | 2,322 | - | 19,457,109 | - | 23,280,508 |
| නේවාසිකාගාර | 3,821,076 | - | 2,322 | - | 19,457,109 | - | 23,280,508 |
| | | | | | | | |
| එකතුව | 483,634,692 | 6 ,432,078 | 23,669,710 | 12,088,597 | 205,504,666 | 48,887,910 | 780,217,653 |

## 6.8 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. UVP/BD/D/UWU/2018/05 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2019 මැයි 27 දින |

උපකුලපති,
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති

පහත නිරීක්ෂණයන් දැක්වේ.

(i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

ජංගම නොවන වත්කම් සඳහා එළදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.259,964,609 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තු දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09

සමාලෝචිත වර්ෂයේ රු.32,777,938 ක අවසන් තොගය, ප්‍රමිතියේ 15 ඡේදය අනුව, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් දැක්වේ.

(i) රාජ්‍ය ප්‍රදාන උපයෝජනය කර මිල දී ගන්නා සියළුම ප්‍රාග්ධන වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පදනම් කරගෙන විලම්භිත ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස හඳුනාගෙන තිබුණි. එහෙත් රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන උපයෝජනය කර ඉදිකර තිබුණු ගොඩනැගිලි සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.101,410,747 ක් වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණ ද එය විලම්භිත ආදායම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ii) අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතවී ගිවිසුම් කඩ කළ අයගෙන් පෙර වර්ෂ වලට අදාළ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවී නොතිබුණු රු.6,033,550 ක් මූල්‍ය ප්‍රකාශනවල සටහනක් ලෙසට නොදක්වා ලැබිය යුතු ශේෂ ගිණුමට හර කර ගිවිසුම් කඩ කිරීමේ අරමුදලට බැර කර තිබුණි.

2

(iii) ඉකුත් වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.246,723 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළ 2019 වර්ෂයේදී ගෙවන ලද රු.340,490 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන් කිරීමේ උපලේඛනය අනුව ශේෂය රු. 31,529,645 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශ අනුව ශේෂය රු.31,966,934 ක් වූයෙන් සේවක පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුම රු 437,289 ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

(v) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව තොග විෂයන් 03 ක අවසන් තොගයේ වටිනාකම රු.31,621,585 ක් වූ අතර ඉදිරිපත් කරන ලද තොග සමීක්ෂණ වාර්තා අනුව ගණනය කළ අවසන් තොගයේ වටිනාකම රු. 30,683,466 ක් වූයෙන් රු.938,119 ක් මූල්‍ය ප්‍රකාශන වල වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) නොසැසඳු ශේෂ

සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයට ලැබී තිබුණු ස්ථාවර වත්කම් වල පිරිවැය මූල්‍ය ප්‍රකාශන අනුව රු.190,104,996 ක් වූ අතර ස්ථාවර වත්කම් ලේඛන අනුව එම ශේෂය රු.185,672,916 ක් වූයෙන් රු.4,432,080 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.1,984,409,725 ක් වූ වත්කම් ගිණුම් ශේෂය වෙනුවෙන් විධිමත් ස්ථාවර වත්කම් ලේඛන සහ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින්

පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| නීති, රීති විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 571 | විවිධ ඉදිකිරීම්, සැපයුම් හා සේවා ලබා ගැනීමේ දී අතුරුදවුම් වශයෙන් රඳවාගෙන තිබුණු වර්ෂ 02 ඉක්මවූ රු.21,362,955 ක තැන්පතු නිරවුල් කර නොතිබුණි. එමෙන්ම කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් අර්ධ වාර්ෂික වාර්තා ද පිළියෙල කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 715 (2) | තොග ගබඩාවේ භාණ්ඩ ක්‍රමවත් පරිදි පහසුවෙන් සොයාගෙන හරි වැරදි බැලිය හැකිවන පරිද්දෙන් ක්‍රමානුකූලව ගබඩා කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 757(2) | සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| 7:2 ඡේදය | විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | |
| XX පරිච්ඡේදයේ 3(1) වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා නිවාඩු තහවුරු කර ගැනීම සඳහා පැමිණීමේ ලේඛනයක් නඩත්තු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ | |
| 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන චක්‍රලේඛය | විශ්වවිද්‍යාල අභ්‍යන්තර විභාග ප්‍රතිඵල, විභාගය පවත්වා මාස 03 ක් ඇතුළත නිකුත් කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද විභාග 14 ක ප්‍රතිඵල නිකුත් කිරීමේදී නියමිත කාලය ඉක්මවා මාස 01 සිට මාස 02 දක්වා වූ ප්‍රමාදයන් සිදුවී තිබුණි. |
| (ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛය | එක් එක් මාසය වෙනුවෙන් විශ්වවිද්‍යාලය සතු වාහන 03 ක ප්‍රවාහන සේවා සටහනක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2017 හා 2018 වර්ෂවල උපාධි පාඨමාලා 13 ක් සඳහා සිසුන් 1,662 ක් බඳවාගත යුතුව තිබුණ ද සිසුන් 1,439 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණි. ඒ අනුව අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සිසුන් 223 ක් අඩුවෙන් ඇතුලත් කර ගැනීම තුලින් සම්පූර්ණ සම්පත් ධාරිතාවය උපයෝජනය කර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.

(ආ) ඉහළ ගුණාත්මක භාවයෙන් යුත් අන්තර්ජාතික මට්ටමේ පාඨමාලා, අවම පිරිවැයක් යටතේ හඳුන්වාදීම තුලින් බඳවාගනු ලබන විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නංවා ගැනීම විශ්වවිද්‍යාලයේ අරමුණක් වී තිබුණ ද 2016 හා 2017 වර්ෂ වලදී එක් විදේශීය සිසුවෙකු බැගින් ලියාපදිංචි වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී කිසිදු සිසුවෙකු ලියාපදිංචි වී නොතිබුණි.

(ඇ) තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම

(i) 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2015 සැප්තැම්බර් 09 දිනැති 5/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ චක්‍රලේඛ ලිපිය අනුව තත්කාර්ය අතුරු අග්‍රිම ගෙවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

- ගණන් දීමේ නිලධාරියෙකු විසින් මාණ්ඩලික නිලධාරියෙකුට එක් වරකදී ලබාදිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිම ප්‍රමාණය රු.100,000 ක් වන අතර එම සීමාව ඉක්මවන්නේ නම් භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගත යුතු ය. එසේ වුව ද සමාලෝචිත වර්ෂය තුල අනුමැතියකින් තොරව එම සීමාව ඉක්මවා අවස්ථා 14 කදී රු.3,485,093 ක අතුරු අග්‍රිම ලබාදී තිබුණි.

- තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දිය හැක්කේ මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් වුව ද මාණ්ඩලික නොවන නිලධාරීන්ට අවස්ථා 252 කදී රු.4,987,433 ක අග්‍රිම ලබාදී තිබුණි.

9

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව අතුරු අග්‍රිම එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුව ද අවස්ථා 73 කදී ලබාදී තිබුණු අග්‍රිම රු.2,178,920 ක් මාස 01 සිට මාස 04 දක්වා කාලයක් ප්‍රමාද වී පියවා තිබුණි.

(ii) තත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගැනීමේදී එම කාර්යයට අවශ්‍ය ඇස්තමේන්තුවක් සකස් කර තිබුණ ද අවස්ථා 223 කදී ලබාගෙන තිබුණු රු.3,961,786 මුදලින් සියයට 25 කට වඩා මුදල් ඉතිරිව ආපසු ගෙවා තිබුණි.

2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) විශ්වවිද්‍යාලය මගින් වර්ෂ 2015 දී රු.2,657,499 ක් වැය කර ශිෂ්‍ය ඉගැනුම් ක්‍රියාකාරකම් වල යෙදවීමේ අරමුණින් මිලදී ගෙන තිබුණු රෝද දෙකේ ට්‍රැක්ටර් රථය, රෝද හතරේ ට්‍රැක්ටර් රථය ,නඟුල හා උපාංග මිලදී ගත් අරමුණ ඉටු කරගැනීම සඳහා භාවිතා කර නොතිබීම හා ඌන උපයෝජනය වී තිබීම.

(ආ) 2017 වර්ෂයේදී මිල දී ගෙන තිබුණු රු.5,240,300 ක් වටිනා ප්‍රෙෂර් ප්ලේට් ඇපරේටර්ස් (Pressure Plate Apparatus) උපකරණය මේ දක්වා උපයෝජනය කර නොතිබුණි.

(ඇ) භාණ්ඩ මිළදී ගැනීමේදී අවශ්‍යතාවය හා ගබඩාවේ පවතින තොග මට්ටම කෙරෙහි අවධානය යොමු නොකර පහත සඳහන් භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

- 2015 වර්ෂයේ මිළදී ගෙන තිබුණු රු.543,714 ක් වටිනා A3 වර්ගයේ ඡායා පිටපත් කඩදාසි පැකට් 591 ක් 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට නොගෙන තිබුණි.

- 2017 වර්ෂයේදී මිළදී ගෙන තිබුණු රු.93,500 ක් වටිනා සිස්ටම් ෆිටින් සෙට් හැන්ඩ්ල් ටයිප් (System Fitting Set Handle Type) ඒකක 170 ක් 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට නොගෙන තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) ඌව කර්මාන්ත කේන්ද්‍රීය අරමුදල, උපකුලපති අරමුදල සහ සුභසාධක අරමුදලෙහි එකතුව වූ රු.4,736,843 ක් සමාලෝචිත වර්ෂය තුල කිසිදු ප්‍රයෝජනයකට නොගැනීම නිසා අදාළ අරමුදල් පිහිටුවීමේ අරමුණු ඉටු වී නොතිබුණි.

(ඉ) ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කෘෂි පාදක කර්මාන්ත වල ආර්ථික ඵලදායිතාවය සහ රජයේ පුහුණු මධ්‍යස්ථාන වල ඵලදායිතාවය පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා 2018 වර්ෂයේදී ලබා දී තිබුණු රු.591,250 ක මුදලින් රු.397,290 ක් උපයෝජනය කර නොතිබුණි.

(ඊ) 2017 වර්ෂයේදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ විවිධ වැඩසටහන් සඳහා ඌව පළාත් සභාවෙන් ලැබී තිබුණු රු.100,000 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි.

(උ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ මහාචාර්ය පුරප්පාඩු 05 ක් හා කථිකාචාර්ය පුරප්පාඩු 36 ක් පුරවා නොතිබුණි.

(ඌ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ පරිපාලන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 73 ක් පුරවා නොතිබුණි.

(එ) 2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් යථෝක්ත සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගතව නොතිබුණු අතර ඉටුකර ගත යුතු ඉලක්කයන්ගේ මූල්‍ය අගයන් දක්වා නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය ඇගයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.

11

(ඒ) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව ළඟාකර ගතයුතු අරමුණු සහ ඉලක්ක කරා ළඟාවීමේ සූදානම පිළිබඳ දැනුවත්භාවයක් ලබා තිබුණ ද පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව ය.

- තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීම.
- තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනා ගැනීම.

(ඓ) විශ්වවිද්‍යාලයේ පසුගිය වර්ෂ 04 ක් සඳහා ජල පරිභෝජනය වෙනුවෙන් රු.19,695,753 ක් වැයකර තිබුණු අතර, අපජලය පිරිපහදු පද්ධතිය මගින් ලබාගත් ජලය බැහැර කරන අතර එම අපජලය වාහන සේදීම හා අනෙකුත් විවිධ නඩත්තු කටයුතු සඳහා උපයෝජනය කිරීම් කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ඔ) සංශෝධිත අයවැය ලේඛනයේ සලසා තිබුණු රු.650,000,000 ක ප්‍රතිපාදන වලින් රු.221,807,142 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණු අතර එය ප්‍රතිපාදනය කරන ලද මුළු මුදලින් සියයට 34 ක් විය. එමෙන්ම සංශෝධිත අයවැය ලේඛනය අනුව රැස්කිරීමට අපේක්ෂිත ස්වයං මූල්‍ය වැඩසටහන්වල ආදායම රු.5,875,000 ක් වුවද රැස්කර තිබුණු ආදායම රු.3,499,377 ක් වූයෙන් රැස් කිරීමට අපේක්ෂිත ආදායමෙන් රු.2,375,623 ක් හෙවත් සියයට 40 ක් රැස්කර නොතිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඕ) විශ්වවිද්‍යාලයීය ඉදිකිරීම් හා අලුත්වැඩියාවන් වලදී යොදාගන්නා ඌව පළාත් සභාවේ ගොඩනැගිලි ඉදිකිරීම්, වැඩි දියුණු කිරීම් සහ නඩත්තු කටයුතු සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමට උපයෝගී කරගන්නා ගොඩනැගිලි ගාස්තු උපලේඛනය (BSR) තුළ අඩංගු පොදු උපදෙස් තුළ වැඩ සුපරීක්ෂණය සහ වැඩ බිම් ආරක්ෂාව වැනි පොදු කාර්යය පිරිවැය සඳහා වන සියයට 10 ක් සෑම රේටයක් (Rate) තුළම ඇතුළත් වන බැවින් වැඩ සුපරීක්ෂණය සහ ආරක්ෂාව සඳහා වෙනම ගෙවීමක් විශ්වවිද්‍යාලය පිළියෙල කරන ඇස්තමේන්තු වල ඇතුලත් කළ නොහැකිය. එසේ වුවද නියැදි පදනමක් මත සිදුකළ පරීක්ෂාවේදී කර්මාන්ත 03 ක් සඳහා වැඩ සුපරීක්ෂණය සඳහා රු.155,250 ක් සහ වැඩබිම් ආරක්ෂාව සඳහා රු.247,250 ක් ලෙස රු. 402,500 ක් ඇතුළත් කර ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

12

**6.9 ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්,සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

| | වාර්තාවේ සඳහන් නිරීක්ෂණ | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| **1.2** | තත්වාගණනය කළ මතය සඳහා පදනම | |
| **(අ)** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති | |
| **(i)** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 | |
| | ජංගම නොවන වත්කම් සඳහා එළදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.259,964,609 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තු දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් නැවත තක්සේරු කිරීමක් මේ දක්වා සිදුකොට නොමැති අතර, එම වත්කම් සියල්ල නැවත තක්සේරු කිරීමට (Revaluation) සැලසුම් කොට ඇත. ඒ අනුව 48 වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී කමිටුවක් පත් කොට අදාල ක්‍රියාවලිය ආරම්භ කිරීමට කටයුතු යොද ඇත. |
| **(ii)** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 | |
| | සමාලෝචිත වර්ෂයේ රු.32,777,938 ක අවසන් තොගය, ප්‍රමිතියේ 15 ඡේදය අනුව, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත ගිණුම්ගත කර නොතිබුණි. | පහත කරුණු වලට යටත්ව එකඟ නොවේ.<br><br>2018.12.31 දිනට පරිභෝජන තොගය පහත අයිතමයන්ගෙන් සමන්විත වේ. |

| | | |
|---|---|---|
| | | ලිපිද්‍රව්‍ය තොගය 6,662,819<br>නඩත්තු තොග හා වෙනත් 1,176,070<br>විදුලි උපාංග 400,183<br>ඖෂධ තොගය <u>756,171</u><br><u>8,995,243</u><br><br>ඉහත තොග අයිතමයන් අගය කිරිමේදි පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත තොග අගය කරන ලදී. එනම්, 2018.12.31 දිනට පැවැති තොගයේ අඩංගු වු භාවිතා කළ හැකි තත්ත්වයේ නොතිබු අයිතමයන් වෙනමම හදුනා ගත් අතර ඒවායෙහි මූල්‍යමය වටිනාකමක් නොමැති සේ සලකා තොග අගය කිරීම් කරන ලදී. ඒ අනුව එම භාවිතයට ගත නොහැකි වූ අයිතම ඉවත් කිරීම සඳහා 2019.03.22 පැවති පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ අතර අදාළ ගැලපීම් ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරමි.තවද රුː 23,782,696 වටිනාකම ඇති රසායන ද්‍රව්‍ය හා විදූරු ද්‍රව්‍ය (Chemical and Glass ware) තොගය ද පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත තොග අගය කරන ලදී. |
| **(ආ)** | **ගිණුම්කරණ අඩුපාඩු** | |
| **(i)** | රාජ්‍ය ප්‍රදාන උපයෝජනය කර මිල දී ගන්නා සියළුම ප්‍රාග්ධන වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පදනම් කරගෙන විලම්භිත ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස හඳුනාගෙන තිබුණි. එහෙත් රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන උපයෝජනය කර ඉදිකර තිබුණු ගොඩනැගිලි සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.101,410,747 ක් වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණ ද එය විලම්භිත ආදායම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | එකඟ නොවේ.<br>ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ රාජ්‍යය ප්‍රදාන යටතේ මිලදී ගන්නා ප්‍රාග්ධන වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පදනම් කරගෙන විලම්භිත අදායමක් ලෙස ගිණුම් ගත කරන බව දක්වා ඇත.<br>එමෙන්ම, විශ්වවිද්‍යාලය පිහිටුවීමට අදාල ප්‍රාග්ධන ප්‍රදානයන් සම්මුච්චිත අරමුදලට බැර කරන බව එහි තව දුරටත් දක්වා ඇත. ඒ අනුව විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව ගිණුම් පිළියෙළ කර ඇති බව තවදුරටත් දන්වා සිටිමි. |

| | | |
|---|---|---|
| **(ii)** | අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතවී ගිවිසුම් කඩ කළ අයගෙන් පෙර වර්ෂවලට අදාල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවී නොතිබුණු රු.6,033,550 ක් මූල්‍ය ප්‍රකාශනවල සටහනක් ලෙසට නොදක්වා ලැබිය යුතු ශේෂ ගිණුමට හර කර ගිවිසුම් කඩ කිරීමේ අරමුදලට බැර කර තිබුණි. | පහත කරුණු වලට යටත්ව එකඟ වේ.<br>ගිවිසුම් කඩ කල එහෙත් නොපියවූ ශේෂ පිළිබද ව 2014 වර්ෂයේදී රාජ්‍ය විගණන අංශය විසින් විමසන ලදුව, 2015 වර්ෂයේදී 2015.12.31 දිනට ලැබිය යුතු වූ රු.7,720,771/- ක මුදලක් ලැබිය යුතු ගිණුම් යටතේ ගිණුම් ගත කරන ලදි. මීට අදාළ මුදල් ලැබීම් පියවීමෙන් අනතුරුව 2018.12.31 දිනට ශේෂය රු.6,033,550/- ක් විය. ඉන් රු.376,207/- ක මුදලක් 2019 වසරේ මුල් මාස 04 තුලදී පියවන ලද අතර විස්තර පහත පරිදි වේ.<br><br><u>නම</u>      <u>2019 වසර තුළ මුදල් ලැබීම්</u><br><br>E.K.N.D.ප්‍රනාන්දු මිය    300,000/-<br>M.A.R.N. පෙරේරා මහතා    76,207/-<br>376,207/-<br>ඉහත ආකාරයට මුදල් ලැබීම් සිදුවන නිසා කෙටි කාලයක් තුලදී ඉහත කරුණ නිවැරදි කර ගැනීමට හැකිවන බව දන්වා සිටිමි.<br><br>එමෙන්ම 2017.12.31 දින තෙක් අනුගමනය කල ඉහත ක්‍රමවේදය 2018 වසර තුලදී වෙනස් කරන ලදි. ඒ අනුව මුදල් ලැබීම් පමණක් ගිවිසුම් කඩ කිරීමේ අරමුදලට බැර කොට ලැබිය යුතු ශේෂ සටහනක් මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කිරීම මඟින් ඉහත දෝෂය නිවැරදි කරන ලදි. |
| **(iii)** | ඉකුත් වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.246,723 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළ 2019 වර්ෂයේදී ගෙවන ලද රු.340,490 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | විශ්වවිද්‍යාලය විසින් උපචිත පදනම අනුව ගිණුම් සකස් කිරීමේදී ප්‍රායෝගිකව ගිණුම්ගත කල හැකි වියදම් අදාළ වර්ෂය හි වියදමක් ලෙස ගිණුම් ගත කෙරේ.<br><br>උදා :- විශ්වවිද්‍යාල භූමියෙන් පිටත පිහිටි නේවාසිකාගාර වල ජල හා විදුලි බිල්පත් ගෙවීම් කටයුතු සඳහා විශ්වවිද්‍යාලය වෙත ලැබීමේදී ප්‍රමාදයන් සිදුවිම වැලක්විය නොහැක. එවැනි අවස්ථා වලදී එක් ගිණුම් වර්ෂයටකට බිල්පත් 12 ක් වාර්තා වන සේ |

| | | |
|---|---|---|
| | | ගිණුම් පිළියෙළ කරනු ලැබේ.<br>එමෙන්ම ගිණුම් වර්ෂය අවසානයේදී, එම වර්ෂයට අදාළ සියලුම වියදම් වාර්තා නියමිත දින ගණනක් ඇතුලත ලබා දෙන ලෙස අංශ ප්‍රධානීන් ලිඛිතව දැනුවත් කෙරෙන අතර එම වාර්තා පදනම් කරගෙන ගිණුම් පිළියෙළ කරනු ලැබේ. |
| **(iv)** | සමාලෝචිත වර්ෂයේදී දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීමේ උපලේඛණය අනුව ශේෂය 31,529,645 ක් වූ මූල්‍ය ප්‍රකාශ අනුව ශේෂය 31,966,934 ක් වූයෙන් සේවක පාර්තෝෂික වෙන්කිරීමේ ගිණුම රු.437,289 ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | එකග වේ.<br>රු 437,289 ක මුදල පාරිතෝෂිත වෙන් කිරිමේ ගිණුමෙන් ඉවත් කිරිමට කටයුතු කරමි. |
| **(v)** | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව තොග විෂයන් 3 ක අවසන් තොගයේ වටිනාකම රු.31,621,585 ක් වූ අතර, ඉදිරිපත් කරන ලද තොග සමීක්ෂණ වාර්තා අනුව ගණනය කර අවසන් තොගයේ වටිනාකම රු. 30,683,466 ක් වූයෙන් රු. 938,119 ක් මූල්‍ය ප්‍රකාශන වල වැඩියෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත් තොගයේ වටිනාකම හා තොග සමික්ෂණ වාර්තා අනුව තොගයේ වටිනාකම අතර වෙනස පැහැදිලි කිරීමට පහත සැසඳුම ඉදිරිපත් කරමි.<br>**<u>මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව තොගය</u>**<br>ලිපිද්‍රව්‍ය තොගය 6,662,819.25<br>නඩත්තු තොග හා වෙනත් 1,176,069.85<br>විදුලි උපාංග <u>400,182.80</u><br>8,239,071.90<br>එකතු කළා<br>නැවත ගිණුම් ගත කළ තොගය 16,750.00<br>(කැබඑසබමදම් ඡ්චැරි)<br>අතිරික්ත තොගයේ වටිනාකම <u>52,060.79</u><br>68,810.79<br>අඩුකළා<br>ඌණ තොගවල වටිනාකම (14,226.08)<br>භාවිතා කළ නොහැකි වූ<br>තොගයේ වටිනාකම <u>(530,680.70)</u><br>(544,906.78)<br>හඳුනාගත් වෙනස (110,680.66)<br>තොග සමීක්ෂණ වාර්තා අනුව ශේෂය <u>7,652,295.25</u> |

**6.9 ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

| | | |
|---|---|---|
| | | රු.110,680/= ක් වු වෙනස පිළිබඳ පරීක්ෂා කොට අදාල නිවැරැදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.<br><br>තවද රු. 334,801 රසායන ද්‍රව්‍ය හා වීදුරු උපකරණ (Chemical & Glassware) තොගයේ වෙනසට හේතුව වුයේ අදාල තොග සමීක්ෂණ කමිටුව අදාල වටිනාකම් ගණනය කිරීමේ දී සිදුවූ දෝෂයක් වන අතර, එය ඉදිරියේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | **නොසැසඳූ ශේෂ** | |
| (අ) | සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයට ලැබී තිබුණු ස්ථාවර වත්කම් වල පිරිවැය මූල්‍ය ප්‍රකාශන අනුව රු.190,104,996 ක්වූ අතර ස්ථාවර වත්කම් ලේඛන අනුව එම ශේෂය රු.185,672,916 ක් වූයෙන් රු.4,432,080 ක වෙනසක් නිරීක්ෂණය විය. | එම වෙනස පිළිගන්නා අතර, එම වෙනසට හේතු වූයේ එම මිලදීගැනීම් සිදුකර ඇත්තේ භාණ්ඩාගාර නොවන මුදල් හා ප්‍රදානය කිරීම් මගිනි. කෙසේ වෙතත් එම ස්ථාවර වත්කම් ද, ස්ථාවර වත්කම් ලේඛනයට යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | **විගණනය සඳහා සාක්ෂි නොවීම** | |
| | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.1"984"409"725 ක්වූ වත්කම් ගිණුම් ශේෂය වෙනුවෙන් විධිමත් ස්ථාවර වත්කම් ලේඛණ හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | සියළුම ස්ථාවර වත්කම් ශේෂ ඇතුලත් ස්ථාවර වත්කම් ලේඛණය/භාණ්ඩ සමීක්ෂණ වාර්තා — 2018 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2019.05.22 දින ජාතික විගණන කාර්යාලය වෙත ලබා දෙන ලදී. |

**6.9 ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකුලව මා විගණන සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරනයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකුලව පිළියෙල කිරීම හා සධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දි, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදි මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේනම් හැර අඛණ්ඩ පැවත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවත්මට අදාල කරුණු අනාවරණය කිරීමට ද කළමනාකරණයේ වගකීමකි.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තා කරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරණු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදයම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත් පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ආනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් වියහැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේ දි හා තක්සේරු කිරීමේ දී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනිම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතානාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබද මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම් කරන ප්‍රතිපත්ති වල හා ගිණුම් කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවත්ම පිළිබද ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම් ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවත්ම පිළිබද පදනම යොදාගැනිමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනාශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මාගේ මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙලිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙලිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අඛණ්ඩ පැවත්ම අවසන් වීමට හැකිය.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබදව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබද වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සදහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සදහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණන සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සදහන් අවශතාවය අනුව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සදහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

**2.1** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සදහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව

**6.9 ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

**2.2** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර, යම් අදාල ලිඛිත නීතියකට විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව

| | **නීතී, රීතී හා රෙගුලාසි ආදියට යොමුව** | **විස්තරය** | **විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(අ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| **(i)** | මුදල් රෙගුලාසි 571 | විවිධ ඉදිකිරීම්, සැපයුම් හා සේවා ලබා ගැනීමේ දී අතරුඳවුම් වශයෙන් රඳවාගෙන තිබුණු වර්ෂ 02 ඉක්මවූ රු.21,362,955 ක තැන්පතු නිරවුල් කර නොතිබුණි. එමෙන්ම කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් අර්ධ වාර්ෂික වාර්තා ද පිළියෙල කර නොතිබුණි. | ඉදිකිරීම් සම්බන්දව රදවා ගෙන ඇති අතරුදවුම් මුදල් අදාල අවසන් බිල්පත්‍ර නිරවුල් වූ පසුව නිදහස් කිරීමට කටයුතු කරන අතර, අනෙකුත් වත්කම් මිලදී ගැනීමට අදාලව රදවා ගත් මුදල් අදාල කොන්දේසි සම්පූර්ණ කල පසුව සැපයුම්කරුවන් වෙත නිදහස් කිරීමට කටයුතු කරමි.<br>සෑම අර්ධ වර්ෂයකම අවසානයේ දී, ඉකුත් වූ සියළුම තැන්පතු පිළිබදව ලැයිස්තු පිළියෙල කරන ලෙස මුදල් අංශයට උපදෙස් ලබා දී ඇත. |
| **(ii)** | මුදල් රෙගුලාසි 715 (2) | තොග ගබඩාවේ භාණ්ඩ ක්‍රමවත් පරිදි පහසුවෙන් සොයාගෙන හරි වැරදි බැලිය හැකිවන පරිද්දෙන් ක්‍රමානුකූලව ගබඩා කර නොතිබුණි. | දැනට ගබඩාවේ පවතින සීමිත ඉඩ ප්‍රමාණය සැලකිල්ලට ගෙන ගබඩා අයිතම පෙළගස්වා ඇති අතර, එය තවදුරටත් ක්‍රමානුකූලව පවත්වාගෙන යන ලෙසට අදාල අංශ වලට උපදෙස් ලබා දී ඇත. |
| **(iii)** | මුදල් රෙගුලාසි 757(2) | සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ 2018 වසර අවසාන විභාගය ජනවාරි 07 දක්වා පැවතීම, වාර්ෂික පර්යේෂණ සැසිය පෙබරවාරි 07 - 08 දින පැවැත්වීම හා නවක සිසුන් බඳවා ගැනීම පෙබරවාරි 25 දින සිදුකෙරුනි. ඒ සඳහා විශ්වවිද්‍යාලයේ දේශන ශාලා, විද්‍යාගාර හා ආපනශාලා සකස් කිරීම හේතුවෙන් 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය ප්‍රමාද විය. එයට හේතු වන්නේ ඉහත ක්‍රියාකාරකම් සඳහා එහි ඇති ස්ථාවර වත්කම් භාවිතා කිරීම හේතුවෙන් ගණනය කිරීමට අපහසු බැවිනි. ඒ අනුව 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2015.05.22 වන දින ජාතික විගණන කාර්යාලය වෙත ලබා දෙන ලදී. |
| **(ආ)** | භාණ්ඩාගාර චක්‍රලේඛ (2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය) | | |
| | 7.2 ඡේදය | විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍රයට අදාල වන කටයුතු සම්බන්ධව මූලික තොරතුරු හා ක්‍රමවේදයන් පිළිබඳ කටයුතු මේ වන විට දැනටමත් අවසන් කර ඇත. කෙසේ නමුත් අවසාන |

**6.9 ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

| | | | |
|---|---|---|---|
| | | | මෙහෙයුම් වාර්තාව පිළිබඳ සියලු කටයුතු සිදුකරමින් පවතී. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | | |
| | XX පරිච්ඡේදයේ 3(1) වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා නිවාඩු තහවුරු කර ගැනීම සඳහා පැමිණුමේ ලේඛණයක් නඩත්තු කල යුතු වුවත්, එසේ කර නොතිබුණි. | විශ්වවිද්‍යාල පද්ධතිය තුල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිළධාරීන් සඳහා අත්සන් කිරීමේ ලේඛනයක් හෝ ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීම සිදු නොවන අතර, අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අධ්‍යයන වර්ෂය ආරම්භයේ දී දේශන සඳහා දෙනු ලබන කාල සටහන් වලට අනුකූලව එම නිළධාරීන් විසින් දේශන කටයුතු පවත්වාගෙන යනු ලැබේ. එම දේශන වාර්තා අධ්‍යයන අංශය තුල ලේඛන ගත වන අතර, සෑම මසකම අවසානයේ දී වැටුප් හා වේතන ගෙවීමට පෙර වැටුප් අංශය මඟින් අදාල අධ්‍යයන අංශ ප්‍රධානීන්ගෙන් අදාල අධ්‍යයනංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිළධාරීන් සේවයේ නියුක්ත බවට තහවුරුවක් ලබා ගනී. එම තහවුරුව පදනම් කරගෙන අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා වේතන ගෙවනු ලබයි. |
| (ඈ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ | | |
| | 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන චක්‍රලේඛය | විශ්වවිද්‍යාල අභ්‍යන්තර විභාග ප්‍රතිඵල, විභාගය පවත්වා මාස 03 ක් ඇතුළත නිකුත් කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද විභාග 14 ක ප්‍රතිඵල නිකුත් කිරීමේදී නියමිත කාලය ඉක්මවා මාස 01 සිට මාස 02 දක්වා වූ ප්‍රමාදයන් සිදුවී තිබුණි. | • සියළුම පීඨ සඳහා එකම කාල සීමාවක විභාග කාල සටහන ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාලයක් ලෙස ඒ සඳහා මාස 1 ½ පමණ කාලයක් වැයවීම<br>• සමහර විෂය ඒකක, අධ්‍යයන පාඨමාල අතර පමණක් නොව අධ්‍යයන පීඨ අතර ඇති එකිනෙක සබඳතාවය මත සමහර ආචාර්යවරුන්ට එම සියළුම පීඨ හා පාඨමාලවල අයත් සිසුන්ගේ ප්‍රශ්න පත්‍ර ඇගයීමට සිදුවීම<br>• අළුතින් ස්ථාපිත විශ්වවිද්‍යාලයක් ලෙස ජ්‍යෙෂ්ඨ මට්ටමේ ආචාර්යවරුන්ගේ හිඟකම මත දෙවනවර පිළිතුරු ඇගයීම් සඳහා වෙනත් විශ්වවිද්‍යාල හා ආයතන වෙත කුරියර් සේවා මඟින් යැවේ. මේ සඳහා සැලකිය යුතු කාලයක් ගතවීම.<br>• විභාග අංශය තවමත් පීඨ අතර මධ්‍යගත නොවීම හා ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණයේ සිට ප්‍රතිඵල පිටකිරීමේ ක්‍රියාවලිය Manual ක්‍රමයට සිදුකිරීම. හා<br>• විභාග අංශය සතුව ප්‍රමාණවත් පරිදි මානව සම්පත |

| | | | |
|---|---|---|---|
| | | | නොමැතිකම වැනි හේතූන් මත මෙවැනි ප්‍රතිඵල ප්‍රමාද සිදුවේ.<br><br>නමුත් අනාගතයේ විභාග ප්‍රතිඵල ප්‍රමාදයන්ගෙන් තොරව නිකුත් කිරීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS system) හඳුන්වා දීමට මේ වන විට පියවර ගෙන ඇත. |
| **(ඉ)** | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| | අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛය | | |
| | | එක් එක් මාසය වෙනුවෙන් විශ්වවිද්‍යාලය සතු වාහන 3 ක ප්‍රවාහන සේවා සටහනක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර, ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | එක් එක් මාසය වෙනුවෙන් රාජකාරි සඳහා බස් රථ වලට අදාල ප්‍රවාහන සේවා සටහනක් යාවත්කාලීන කොට ඇති අතර, එහි පිටපතක් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම 1) ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කිරීමට මෝටර් රථ ප්‍රවාහන අංශයෙන් ඉල්ලීමක් කර නමුත්, මේ දක්වා ඊට නිසි ප්‍රතිචාරයක් ලැබී නොමැති අතර, ඉදිරියේ දී ඔවුන් සමඟ සාකච්ඡා කොට මෙම ඉන්ධන දහනය පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරමි. |

**2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ බලතල,කර්තව්‍ය සහ කාර්යන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව**

| | | |
|---|---|---|
| **(අ)** | 2017 හා 2018 වර්ෂවල උපාධි පාඨමාලා 13 ක් සඳහා සිසුන් 1,662 ක් බඳවාගත යුතුව තිබුණ ද සිසුන් 1,439 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණි. ඒ අනුව අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සිසුන් 223 ක් අඩුවෙන් ඇතුලත් කර ගැනීම තුලින් සම්පූර්ණ සම්පත් ධාරිතාවය උපයෝජනය කර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි. | විශ්වවිද්‍යාලය සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව මඟින් සිදුකරනු ලබයි. ඒඅනුව 2015/2016 ශිෂ්‍යය කණ්ඩායම සඳහා 2017 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අවස්ථා 7 ක දී ද, 2016/2017 ශිෂයය කණ්ඩායම් සඳහා අවස්ථා 4 ක දී ද ශිෂය ලැයිස්තු යොමුකල ශිෂ්‍යන් නමුත්, තෝරාගත් ශිෂ්‍යයන් ලියාපදිංචිය සඳහා සහභාගී නොවීම, ලියාපදිංචි වූ ශිෂ්‍යයන් ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ උපදෙස් මත වෙනත් විශ්වවිද්‍යාල වෙත මාරුවීම හා ලියාපදිංචිය |

| | | |
|---|---|---|
| | | අවලංගු කරගනීම වැනි හේතු මත අපේක්ෂිත ශිෂ්‍යය සංඛ්‍යාව සම්පූර්ණ නොවීය.<br>එහෙත් විශ්වවිද්‍යාලය විසින් අදාල පුරප්පාඩු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | ඉහළ ගුණාත්මක භාවයෙන් යුත් අන්තර්ජාතික මට්ටමේ පාඨමාලා, අවම පිරිවැයක් යටතේ හඳුන්වාදීම තුලින් බඳවාගනු ලබන විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නංවා ගැනීම විශ්වවිද්‍යාලයේ අරමුණක් වී තිබුණ ද 2016 හා 2017 වර්ෂ වලදී එක් විදේශීය සිසුවෙකු බැගින් ලියාපදිංචි වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී කිසිදු සිසුවෙකු ලියාපදිංචි වී නොතිබුණි. | පාඨමාලාවන් සඳහා විදේශිය ශිෂ්‍යයන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් විශ්වවිද්‍යාලය වෙත යොමු කරන අතර, එසේ යොමු කරන ලද ශිෂ්‍යයන් බඳවා ගැනීමට කටයුතු කර ඇත. |
| (ඇ) | තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම | |
| (i) | 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2015 සැප්තැම්බර් 09 දිනැති 5/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ චක්‍රලේඛ ලිපිය අනුව තත්කාර්ය අතුරු අග්‍රිම ගෙවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය. | |
| | ගණන් දීමේ නිලධාරියෙකු විසින් මාණ්ඩලික නිලධාරියෙකුට එක් වරකදී ලබාදිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිම ප්‍රමාණය රු.100,000 ක් වන අතර, එම සීමාව ඉක්මවන්නේ නම් භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගත යුතු ය. එසේ වුව ද සමාලෝචිත වර්ෂය තුල අනුමැතියකින් තොරව එම සීමාව ඉක්මවා අවස්ථා 14 කදී රු.3,485,093 ක අතුරු අග්‍රිම ලබාදී තිබුණි. | විශ්වවිද්‍යාලයට ආවේණික වූ විශේෂ මෙන්ම අත්‍යවශ්‍ය කටයුතු සිදු කිරීමේදී (උදා :- ශිෂ්‍ය ක්ෂේත්‍ර වැඩසටහන් / ක්ෂේත්‍ර චාරිකා / වාර්ෂික පර්යේෂණ විද්වත් සමුළුව/ විෂය මාලා සංශෝධන / වාර්ෂික උපාධි ප්‍රධානෝත්සවය ) රු. 100,000.00 ඉක්මවා අත්තිකාරම් ගෙවීම් සිදු කොට ඇත. එසේම අනුග්‍රාහක මුදල් උපයෝගී කර ගෙන සිදු කරන විශේෂිත වැඩමුළු සඳහා ද මෙසේ අත්තිකාරම් මුදල් ගෙවා ඇත. කෙසේ නමුත් අනෙකුත් සමාන්‍ය කටයුතු සිදු කිරීමේදී අවශ්‍ය වන අත්තිකාරම් රු.100,000.00 ඉක්මවා ගෙවීම් සිදු කර නොමැති බව දන්වමි. |
| | තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දිය හැක්කේ මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් වුව ද මාණ්ඩලික නොවන නිලධාරීන්ට අවස්ථා 252 කදී රු.4,987,433 ක අග්‍රිම ලබාදී | මාණ්ඩලික නොවන නිළධාරීන් වන ස්ථිර සේවයේ නිරත ලිපිකරු හා සාමාන්තර ශ්‍රේණි තනතුරු සඳහා අත්තිකාරම් ගෙවීම් සිදු කොට ඇත. එසේ සිදු කොට ඇත්තේ අදාල අංශ ප්‍රධානි/ මාණ්ඩලික |

| | | |
|---|---|---|
| | තිබුණි. | නිළධාරීන් යටතේ එකවර විශේෂිත කාර්යයන් කිහිපයක් සිදු කිරීමේදී එම මාණ්ඩලික නිළධාරීන් එකවර අත්තිකාරම් මුදල් කිහිපයක් ගෙවීම වැලැක්වීම සඳහා වේ. |
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව අතුරු අග්‍රිම එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුව ද අවස්ථා 73 කදී ලබාදී තිබුණු අග්‍රිම රු.2,178,920 ක් මාස 01 සිට මාස 04 දක්වා කාලයක් ප්‍රමාද වී පියවා තිබුණි. | අදාළ වැඩසටහන පිළිබඳ විස්තරයක් අත්තිකාරම් වවුචර් සමඟ අමුණා ඇත. ඒ අනුව වැඩසටහන පවත්වන දිනය සහ අනෙකුත් විස්තර එහි සඳහන් වේ. එමෙන්ම අදාළ වියදම් සිදු කළ දිනයන්ට අදාළ බිල්පත් අත්තිකාරම් පියවීමේදී උපලේඛණ සමඟ අමුණා ඇත. ඒ අනුව අතුරු අග්‍රිමයන් අදාල කාර්ය අවසන් වූ සැනින් පියවීමට අදාල පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කරමි. |
| **(ii)** | තත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගැනීමේදී එම කාර්යයට අවශ්‍ය ඇස්තමේන්තුවක් සකස් කර තිබුණ ද අවස්ථා 223 ක දී ලබාගෙන තිබුණු රු.3,961,786 ක මුදලින් සියයට 25 කට වඩා මුදල් ඉතිරිව ආපසු ගෙවා තිබුණි. | අවශ්‍ය වන මුදලට සරිලන ඇස්තමේන්තු සකසන ලෙස කාර්ය මණ්ඩලයට උපදෙස් දී ඇති අතර ඉදිරියේදී නිවැරදි ඇස්තමේන්තු වලට අනුව මුදල් නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුල අදාල නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව**

| | | |
|---|---|---|
| **(අ)** | විශ්වවිද්‍යාලය මගින් වර්ෂ 2015 දී රු2,657,499ක් වැය කර ශිෂ්‍ය ඉගැනුම් ක්‍රියාකාරකම් වල යෙදවීමේ අරමුණින් මිලදී ගෙන තිබුණු රෝද දෙකේ ට්‍රැක්ටර් රථය, රෝද හතරේ ට්‍රැක්ටර් රථය සහ නගුල හා උපාංග මිලදීගත් අරමුණ ඉටු කරගැනීම සඳහා භාවිතා කර නොතිබීම හා ඌන උපයෝජනය වී තිබීම. | තාක්ෂණික පීඨය සඳහා දැනට සිසුන් කණ්ඩායම් දෙකක් බඳවා ගෙන ඇති අතර, ඔවුන්ගේ 4 වන වසරේ I&II අර්ධ වාර්ෂික වල විෂය නිර්දේශයට අයත් BET in Mechanical Engineering (Farm Machinery Technology I&II) පාඨමාලා මොඩියුල වල ප්‍රායෝගික ඉගැනුම් ක්‍රියාකාරකම් සඳහා අදාල යන්ත්‍ර හා උපකරණ යෙදවීමට කටයුතු කරනු ලබයි. තවද අදාල යන්ත්‍ර සූත භාවිතා කරමින් සිසුන් සඳහා වැඩමුළුවක් පවත්වා ඇති අතර ඊට අදාල වාර්තා මේ සමග අමුණා ඇත. (ඇමුණුම 2 බලන්න)<br>ඊට අමතරව රෝද 2 සහ 4 ට්‍රැක්ටර් රථය විශ්වවිද්‍යාලයේ පහත දක්වා ඇති සාමාන්‍ය පරිපාලන කටයුතු වලට යොදවා ඇති බව දන්වා සිටිමි.<br><br>(I) විශ්ව විද්‍යාලය තුළ හා විශ්ව විද්‍යාලයෙන් පිටත නේවාසිකාගාර සඳහා ගෘහභාණ්ඩ ප්‍රවාහනය.<br>(II) විභාග කටයුතු සඳහා දේශනශාලා සැකසීම සඳහා උපකරණ හා ගෘහභාණ්ඩ ප්‍රවාහනය. |

**6.9 ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

| | | |
|---|---|---|
| | | (III) සිසුන්ගේ ක්‍රියාකාරකම් සඳහා ගෘහභාණ්ඩ, කොඩි කණු හා වෙනත් අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම.<br>(IV) ගොවිපළ සඳහා පැලප්‍රවාහනය, පොහොර ප්‍රවාහනය හා අවශ්‍ය විට ජලය ප්‍රවාහනය සිදුකරගැනීම.<br>(V) අධ්‍යයන හා අනධ්‍යයන අංශවල අවශ්‍ය ද්‍රව්‍ය, කල් ඉකුත්වූ ලිපිගොනු වෙනත් ස්ථාන සඳහා ප්‍රවාහනය. |
| (ආ) | 2017 වර්ෂයේදී මිල දී ගෙන තිබුණු රු.5ල240ල300 ක් වටිනා ප්‍රෙෂර් ප්ලේට් ඇපරේටර්ස් (Pressure Plate Apparatū) උපකරණය මේ දක්වා උපයෝජනය කර නොතිබුණි. | මෙම උපකරණය අධික පීඩනයක් යටතේ ක්‍රියාත්මක වන නිසා ආරක්ෂාකාරීව උපකරණය භාවිතා කිරීම සඳහා ස්ථිරව සාදන ලද වෙන්වූ ස්ථානයක් අවශ්‍ය වේ. ඒ අනුව ඒ සඳහා දැනට ස්ථානයක් පාංශු ජල විද්‍යාගාරය ඉදිරිපස ඇති විද්‍යාගාරයෙන් වෙන්කරවාගැනීමට ක්‍රියාකර ඇත. අදාල Extractor 15 bar suitable for 4 ceramic platers උපකරණය මේ වනවිටත් කිහිපවතාවක් (Trials) භාවිතා කර ඇත. |
| (ඇ) | භාණ්ඩ මිළදී ගැනීමේදී අවශ්‍යතාවය හා ගබඩාවේ පවතින තොග මට්ටම කෙරෙහි අවධානය යොමු නොකර පහත සඳහන් භාණ්ඩ මිළදී ගෙන තිබුණි.<br>• 2015 වර්ෂයේ මිළදී ගෙන තිබුණු රු.543,714 ක් වටිනා A3 වර්ගයේ ඡායා පිටපත් කඩදාසි පැකට් 591 ක් ප්‍රයෝජනයට නොගෙන තිබුණි. | A3 වර්ගයේ ඡායා පිටපත් කඩදාසි විභාග අංශයේ ප්‍රයෝජනය සඳහා යොදා ගනු ලබන බව දන්වා සිටිමි. |
| | • 2017 වර්ෂයේදී මිළදී ගෙන තිබුණු රු.93, 500 ක් වටිනා සිස්ටම් ෆිටින් සේට් හැන්ඩ්ල් ටයිප් (System Fitting Set Handle Type) ඒකක 170 ක් 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට නොගෙන තිබුණි. | නඩත්තු අංශයේ ඉල්ලීමට අනුව Handle type system fittings මිළදී ගෙන ඇත. බාහිරව ලබා ගන්නා නේවාසිකාගාරවල අලුත්වැඩියාවන් සඳහා මෙම fittings වර්ගය අවශ්‍ය වන බවත් එමෙන්ම එම fittings වර්ගය වෙළඳපොලේ හිඟයක් පවතින නිසා වැඩි ප්‍රමාණයක් ඉල්ලුම් කල බව නඩත්තු අංශය මඟින් දැනුම් දී ඇත. |
| (ඈ) | ඌව කර්මාන්ත කේන්ද්‍රීය අරමුදල, උපකුලපති අරමුදල සහ සුභසාධක අරමුදලෙහි එකතුව වූ රු.4,736,843 ක් සමාලෝචිත වර්ෂය තුල කිසිඳු ප්‍රයෝජනයකට නොගැනීම නිසා අදාළ අරමුදල් පිහිටුවීමේ අරමුණු ඉටු වී නොතිබුණි. | ඌව කර්මාන්ත ක්‍රේන්ද්‍රීය අරමුදල, උපකුලපති අරමුදල සහ සුභසාධන අරමුදල යන අරමුදල් වල මුදල් භාවිතයට ගැනීමට අවස්ථාවන් ඇති නවූ බැවින් ඒවා තව දුරටත් ආයෝජනය කිරීමට කටයුතු කරන ලදී. |
| (ඉ) | ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කෘෂි පාදක කර්මාන්ත වල ආර්ථික ඵලදායිතාවය සහ රජයේ පුහුණු මධ්‍යස්ථාන වල ඵලදායිතාවය පිළිබඳ | කෘෂිපාදක කර්මාන්ත වල ආර්ථික ඵලදායිතාවය පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයනය සහ රජයේ පුහුණු මධ්‍යස්ථාන වල ඵලදායිතාවය පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයනය කටයුතු මේ වන විට අවසන්ව ඇත. ඊට අදාළ ගෙවීම් කටයුතු නිම කිරීමට සැලසුම් කොට ඇත. |

<table>
<tr><td></td><td>ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා 2018 වර්ෂයේදී ලබා දී තිබුණු රු.591,250 ක මුදලින් රු.397,290 ක් උපයෝජනය කර නොතිබුණි.</td><td></td></tr>
<tr><td>(ඊ)</td><td>2017 වර්ෂයේදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ විවිධ වැඩසටහන් සඳහා ඌව පළාත් සභාවෙන් ලැබී තිබුණු රු.100,000 ක් 2018 දෙසැම්බර් 31 දින වට විටත් උපයෝජනය කර නොතිබුණි.</td><td>මෙම ව්‍යාපෘතියට අදාළව ඌව පළාත් සභාවෙන් ලද රු. 100,000.00 ක මුදල, ව්‍යාපෘති සම්බන්ධීකාරකගේ නිර්දේශය මත නැවත ගෙවීමට කටයුතු කරමි.</td></tr>
<tr><td>(උ)</td><td>විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ මහාචාර්ය පුරප්පාඩු 05 ක් හා කථිකාචාර්ය පුරප්පාඩු 36 ක් පුරවා නොතිබුණි.</td><td>2019 අප්‍රේල් මස 30 වන දිනට අධ්‍යයන කාර්ය මණ්ඩලය
<table>
<tr><th rowspan="2">පීඨය</th><th colspan="2">මහාචාර්ය</th><th colspan="2">කථිකාචාර්ය :ආධුනික කථිකාචාර්ය ඇතුළත්ව*</th><th colspan="2">පුරප්පාඩු (අතිරික්ත)</th></tr>
<tr><th>අනුමත</th><th>තථ්‍ය</th><th>අනුමත</th><th>තථ්‍ය</th><th>මහාචාර්ය</th><th>කථිකාචාර්ය :ආධුනික කථිකාචාර්ය ඇතුළත්ව*</th></tr>
<tr><td>සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම</td><td>02</td><td>-</td><td>75</td><td>66</td><td>02</td><td>09</td></tr>
<tr><td>විද්‍යා හා තාක්ෂණ</td><td>02</td><td>-</td><td>71</td><td>51</td><td>02</td><td>20</td></tr>
<tr><td>කළමනාකරණ</td><td>01</td><td>-</td><td>30</td><td>27</td><td>01</td><td>03</td></tr>
<tr><td>තාක්ෂණික අධ්‍යයන</td><td>-</td><td>-</td><td>11</td><td>10</td><td>-</td><td>01</td></tr>
<tr><td>**එකතුව**</td><td>**05**</td><td>**00**</td><td>**187**</td><td>**154**</td><td>**05**</td><td>**33**</td></tr>
</table>
විශ්වවිද්‍යාලය ආරම්භයේදී සිට පැවති මහාචාර්ය තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා වරින්වර පුවත්පත් දැන්වීම් පලකර තිබූ අතර 2017 නව කාර්ය මණ්ඩල තනතුරු සංශෝධනයේදී එම තනතුරු සංඛ්‍යාව 05 දක්වා අඩුකර තිබුණි.</td></tr>
</table>

| | | |
|---|---|---|
| | | මෙකී තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2017.06.18 වන දින පුවත්පත් දැන්වීමක් පල කල අතර ලැබූ අයදුම්පත් අතර සුදුසුකම් ලත් අයදුම්පත් නොතිබීම හේතුවෙන් බඳවාගැනීම් සිදු නොකෙරුණිග එමනිසා 2019 වසර සඳහා වූ බඳවාගැනීම් සැලැස්මට අනුව 2019 දෙවන කාර්තුවේදී නැවත පුවත්පත් දැන්වීමක් පල කිරීමට කටයුතු කරනු ලැබේ.<br>2019 වර්ෂයේ අප්‍රේල් 30 වන දින වනවිට පුරප්පාඩුව පවතින ස්ථිර කථිකාචාර්ය තනතුරු 33 සඳහා බඳවාගැනීම් සිදුකිරීමට කටයුතු අඛණ්ඩව සිදුකරමින් පවතින අතර ඒ සඳහා 2018.10.21 වන දින විද්‍යා හා තාක්ෂණ පීඨය වෙනුවෙන් පුවත්පත් දැන්වීමක් පල කරන ලද අතර ඊට අදාල බඳවා ගැනීම් කටයුතු සිදු කෙරෙමින් පවතීග ඉතිරි පීඨයන් සඳහා 2019 වර්ෂයේ සඳහා වූ බඳවාගැනීමේ සැලැස්ම අනුව පීඨාධිපතිවරුන්ගේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින් ප්‍රමුඛතා පෙළගැස්මට අනුව 2019 දෙවන කාර්තුවේ සිට සිව්වන කාර්තුව දක්වා ඉතිරි තනතුරු පුරප්පාඩු පිරවීමට සැලසුම් කොට ඇත. |
| (ඌ) | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ පරිපාලන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 73 ක් පුරවා නොතිබුණි. | **විස්තරය** \| **අනුමත** \| **තත්‍ය** \| **පුරප්පාඩු**<br>පරිපාලන කාර්යමණ්ඩලය \| 23 \| 18 \| 05<br>අනෙකුත් විධායක නිලධාරි \| 07 \| 02 \| 05<br>වෛද්‍ය නිලධාරි \| 02 \| 01 \| 01<br>අධ්‍යයන සහාය කාර්යමණ්ඩලය \| 10 \| 04 \| 06<br>අනධ්‍යයන කාර්යමණ්ඩලය \| 189 \| 137 \| 52<br>**එකතුව** \| **231** \| **162** \| **69**<br><br>2019 අප්‍රේල් 30 වන දිනට පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු 52 ක් පවතින අතර මේ අතරින් පරිපාලන හා අනෙකුත් විධායක තනතුරු සඳහා බඳවාගැනීම් සිදුකරනු ලබන්නේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මැදිහත්වීම තුළිනි. එකී අනෙකුත් විධායක නිලධාරි තනතුරු 03 ක් සඳහා පුවත්පත් දැන්වීමක් පලකොට බඳවාගැනීම්වලට අදාල කටයුතු සිදුකරමින් පවතී. |

| | | |
|---|---|---|
| | | එමෙන්ම පුරප්පාඩුව පවතින පරිපාලන හා අනෙකුත් විධායක තනතුරු සඳහා බඳවාගැනීම් සිදුකිරීමට මේ වන විටත් විවිධ අදියර යටතේ කටයුතු සිදුකරමින් පවතී.<br><br>ඉතිරි අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු වලින් පුරප්පාඩු 34 ක් ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 876 ට අනුව සිදුකල යුතු බඳවා ගැනීම් බැවින් අදාල පුරප්පාඩු සංඛ්‍යාව දන්වා නාම ලේඛන ලබාදෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් රේඛීය අමාත්‍යාංශය දැනුවත් කිරීම් කර ඇත. |
| (එ) | 2003 ජූනි 02 දිනැති අංක පී.ඊ.ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් යෝක්ත සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගතව නොතිබුණු අතර ඉටුකර ගත යුතු ඉලක්කයන්ගේ මූල්‍ය අගයන් දක්වා නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය ඇගයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි. | සංයුක්ත සැලැස්ම වාර්ෂිකව සංශෝධනයට ලක්වන අතර ඒ මත ක්‍රියාකාරී සැලැස්මද සංශෝදනයන් සහිතිව ක්‍රියාත්මක තත්ත්වයේ පවතින අතර සංයුක්ත සැලැස්මෙහි සහ ක්‍රියාකාරී සැලැස්මෙහි සියලු අයිතම සඳහා මූල්‍ය අගයන් ඇතුලත් කළ නොහැකි අතර ප්‍රධාන ඉලක්කයන් සඳහා මූල්‍ය අගයන් ඇතුලත් කිරීමට කටයුතු යොදා ඇත. |
| (ඒ) | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව ලඟාකර ගතයුතු අරමුණු සහ ඉලක්ක කරා ලඟාවීමේ සූදානම පිළිබඳ දැනුවත්භාවයක් ලබා තිබුණ ද පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව ය.<br><br>(i) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීම.<br>(ii) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනා ගැනීම | විශ්වවිද්‍යාලය මඟින් තිරසාර සංවර්.ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගනිමින් ඊට අනුරූප වන ප්‍රතිපත්ති සැකැස්මෙහි මූලික අධ්‍යයනයන්හි නියැලෙමින් සිටින අතර තවද, විශ්වවිද්‍යාලය විසින් නිශ්චිත වශයෙන් තිරසාර සංවර්.ධන අරමුණු හා ඉලක්ක ලෙස නිශ්චිතව නිර්.මානය නොකලද විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී සැලැස්මෙහි හා සංයුක්ත සැලැස්මෙහි මෙකී ඉලක්කයන් 04,05,06 හා 09 යන ඉලක්කයන් ආවරණය වන පරිදි සාර්ථකව කාර්ය සාධනයේ යෙදේ. |
| (ඓ) | විශ්වවිද්‍යාලයේ පසුගිය වර්ෂ 04 ක් සඳහා ජල පරිභෝජනය වෙනුවෙන් රු.19,695,753 ක් වැයකර තිබුණු අතර,අප ජලය පිරිපහදු පද්ධතිය මඟින් ලබා ගත් ජලය බැහැර කරන අතර, එම අපජලය වාහන සේදීම හා අනෙකුත් විවිධ නඩත්තු කටයුතු සඳහා | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ඉදිකිරීම හා සංවර්ධනය කිරීමේ මුල් ව්‍යාපෘති සැලැස්මට අනුව අප ජලය පිරිපහදු පද්ධතිය ඉදිකරන ලදී. එහි මුල් අවස්ථාවේ සිදුවූ අඩුපාඩු හේතුවෙන් නැවත ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීමට සිදුවිය. එම නිසා සම්පූරණ පද්ධතිය ඉදිකිරීම සඳහා වසර කීහිපයක කාලයක් ගතවූ අතර මේවනවිට එය නියම තත්වයේ ඇත. මෙම පිරිපහදු පද්ධතිය මගින් ඉවතට |

| | | |
|---|---|---|
| | උපයෝජනය කිරීම් කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | දමන ජලය, වැසි ජලය, උල්පත් ජලය භාවිතා කිරීම සඳහාත් දැනට ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය මගින් ලබාගන්නා ජලයත් කළමණාකරනය කර ගැනීම සඳහා කැබිනට් අනුමැතිය මත ක්‍රියාත්මක කරනු ලබන Alternative Water Supply පද්ධතිය යටතේ කටයුතු සංවිධානය කර ඇත. මෙම ව්‍යාපෘතියේ උපදේශන සේවය CECB ආයතනය මගින් ලබාගන්නා අතර විශ්වවිද්‍යාලයේ ඉදිරි ජල අවශ්‍යතාව හා පිරිපහදු පද්ධතිය මගින් ඉවත්කරන ජලය භාවිතය සඳහා එමගින් කටයුතු කරනු ඇත. ඒ අනුව ජලය කළමණාකරනය කිරීමේ කටයුතු පිළිබඳ අවධානය යොමුකර ඇති අතර ඒ සඳහා මේ වනවිට ඒ සඳහා පියවර ගෙන තිබේ. අදාල කැබිනට් අනුමැතිය යුවීපී/බීඩී/ඩී/යුඩබ්ලිව්යූ/2019/ඒකියු/01 විගණන විමසුමට අදාල පිළිතුර සමඟ ජාතික විගණන කාර්යාලයට ලබා දෙන ලදී. |
| **(ඕ)** | සංශෝධිත අයවැය ලේඛනයේ සලසා තිබුණු රු.650,000,000 ප්‍රතිපාදන වලින් රු.221,807,142 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණු අතර, එය ප්‍රතිපාදනය කරන ලද මුළු මුදලින් 34% ක් විය. එමෙන්ම සංශෝධිත අයවැය ලේඛණය අනුව රැස්කිරීමට අපේක්ෂිත ස්වංය මූල්‍ය වැඩසටහන් වල අදායම රු. 5,875,000 ක් වුවද, රැස්කර තිබුණු ආදායම රු.3,499,377 ක් වූයෙන් රැස් කිරීමට අපේක්ෂිත ආදායම රු. 2,375,623 ක් හෙවත් 40% ක් රැස් කර නොතිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | මාසික මුදල් පුරෝකථන වාර්තාවට අනුව ඉල්ලීම් කරන ලද ප්‍රාග්ධන මුදල් නියමිත පරිදි නොලැබීම හේතුකොට ගෙන සමස්ථ ප්‍රාග්ධන වියදමේ ප්‍රගතිය අඩුවූ බව දන්වමි. පර්යේෂණ සඳහා ඇණවුම් පත් ඉදිරිපත් කරන ලද රසායනික ද්‍රව්‍ය සහ අනෙකුත් උපකරණ සියල්ල නියමිත කාලයක් තුලදි සැපයුම් කරුවන් විසින් අදාල භාණ්ඩ සැපයීම් නොකිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරියක් සිදු වී ඇත.<br>සැලසුම් කරණ ලද පුනරාවර්තන වැඩසටහන් නියමිත කාල සීමාවකදි අවසන් කිරීමට නොහැකිවීම හේතුවෙන් මෙම ප්‍රාග්ධන ඉතිරිවීම් සිදුවී ඇත.<br><br>සැලසුම් හා ඉදිකිරීම් ක්‍රමවේදය යටතේ ඉදිකිරීමට යෝජිත පුස්තකාල ගොඩනැගිල්ල අපේක්ෂිත කාල සීමාව තුලදී අදාල ටෙන්ඩරය ප්‍රදානය කිරීමට නොහැකි වීම හේතුකොට ගෙන මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත.<br><br>Quality Assurance වෘත්තිය මාර්ගෝපදේශ හා ව්‍යවසායකත්ව වැඩසටහන් වලට අදාලව සැලසුම් කරන ලද වැඩසටහන් නියමිත කාල සීමාව තුල අවසන් කිරීමට නොහැකි වීම හේතුකොට ගෙන එම ප්‍රතිපාදන ඉතිරිවී ඇත.<br><br>වත්කම් මිලදී ගැනිම යටතේ සත්‍ය වියදම රු.135,042,767 ක් වුවද එදිනට මිලදී ගැනිමේ ඇනවුම් නිකුත්කොට එහෙත් සැපයුම් කරුවන් භාණ්ඩ සපයා නොමැති ඇණවුම්පත් වල වටිනාකම රු.61,080,759 කි (ඣපපසළඑැා). ඒ අනුව ප්‍රතිපාදන ඉතිරි කිරීම ප්‍රතිශතයක් ලෙස 5% ක් බව දන්වමි. |

| | | |
|---|---|---|
| | | තාක්ෂණික විෂය ධාරාවට අදාලව මිලදී ගැනීමේ ඇණවුම්පත් ඉදිරිපත් කරණ ලද සියලු විද්‍යාගාර උපකරණ අපේක්ෂිත දිනයන්හි සැපයුම් කරුවන් විසින් විශ්වවිද්‍යාලය වෙත සපයා නොමැතිවීම හේතුකොට ගෙන මෙම ප්‍රතිපාදන ඉතිරිවී ඇත.<br>පරිසණක පාඨමාලාවන්ට අදාල ස්වයං මූල්‍ය වැඩසටහන් වල අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව සහභාගි නොවීම හේතු කොට ගෙන සත්‍ය ආදායමේ අඩු වීමක් ඇති බව දන්වමි. |
| **(ඕ)** | විශ්වවිද්‍යාලයීය ඉදිකිරීම් හා අලුත්වැඩියාවන් වලදී යොදාගන්නා ඌව පළාත් සභාවේ ගොඩනැගිලි ඉදිකිරීම්, වැඩි දියුණු කිරීම් සහ නඩත්තු කටයුතු සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමට උපයෝගී කරගන්නා ගොඩනැගිලි ගාස්තු උපලේඛනය (BSR) තුළ අඩංගු පොදු උපදෙස් තුළ වැඩ සුපරීක්ෂණය සහ වැඩ බිම් ආරක්ෂාව වැනි පොදු කාර්යය පිරිවැය සඳහා වන සියයට 10 ක් සෑම රේටයක් (Rate) තුළම ඇතුළත් වන බැවින් වැඩ සුපරීක්ෂණය සහ ආරක්ෂාව සඳහා වෙනම ගෙවීමක් විශ්වවිද්‍යාලය පිළියෙල කරන ඇස්තමේන්තු වල ඇතුලත් කළ නොහැකිය. එසේ වුවද නියදි පදනමක් මත සිදුකළ පරීක්ෂාවේදී කර්මාන්ත 03 ක් සඳහා වැඩ සුපරීක්ෂණය සඳහා රු.155,250 ක් සහ වැඩබිම් ආරක්ෂාව සඳහා රු.247,250 ක් ලෙස රු. 402,500 ක් ඇතුළත් කර ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාලය පිලියෙල කරන ප්‍රමාණ පත්‍ර (BOQ) වල සඳහන් වැඩ බිම් සුපරීක්ෂණය හා වැඩබිම් ආරක්ෂාව යන අයිතමයන්ට රේටයන් ගෙවීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ 47 වන විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ජාවට ලක් විය. එහිදී ඌව පළාත් සභාවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු හා ඌව පලාත් ගොඩනැගිලි ගාස්තු උපලේඛනය (BSR) පිලියෙල කරන කමිටුවේ සාමාජික, ඒ.එම්.ජේ.ටී. ගංගානන්ද මහතාගේ අදහස වූයේ පොදුකාර්ය පිරිවැය යටතේ දක්වා ඇති වැඩබිම් සුපරීක්ෂණය හා වැඩබිම් ආරක්ෂාව සාමන්‍ය තත්වයන් යටතේ දක්වා ඇති අතර, ඊට අමතරව අදාල ව්‍යාපෘතියේ ඉංජිනේරුවරයාට අවශය වුවහොත් CIDA ලේඛණයන් වලට අනුකූලව අදාල කාර්යයේ ස්වාභාවය අනුව විශේෂිත කාර්ය මණ්ඩල හා අයිතමයන් යම් කිසි කාල පරිච්ජේදයකට අදාල ප්‍රමාණ පත්‍ර (BOQ) සඳහා ඇතුලත් කිරීමට බලය ඇති බව පෙන්වා දෙන ලදී. ඒ අනුව 48 වන විගණන හා කළමනාකරන කමිටුවේ දී වැඩිදුරටත් සාකච්ජා කල අතර, එහිදී අදාල ඉදිකිරීමේ ස්වභාවය, ඉංජිනේරුවරයාගේ නිර්දේශය හා ඒ සඳහා සාක්ෂි ලබා දීමෙන් පසුව වැඩබිම් පරීක්ෂණය හා වැඩබිම් ආරක්ෂා යන අයිතමයින් සඳහා ගෙවීම් කිරීමට නිර්දේශ විය. |

## 7. තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම

| අරමුණු | අභිමථාර්ත | සාක්ෂාත් කරගැනීම |
|---|---|---|
| **තිරසාර සංවර්ධන අරමුණු 4 : සැමට සම මට්ටමේ අධ්‍යාපනයක් ලබාදීමට සහතික වීම සහ ජීවිත කාලය පුරා ඉගෙනම් අවස්තා ප්‍රවර්ධනය කිරීම** | ඉගෙනීම, ඉගැන්වීම ,සහ පර්යේෂණ සඳහා විශිෂ්ට යටිතල පහසුකම් ලබා දීම | ඵලදායි සන්නිවේදන ක්‍රියාවලායක් සඳහා නවීන දේශන ශාලා වැඩිදියුණු කිරීම සහ දේශන ශාලා අති නවීන ඉගැන්වීම් ආධාරක සහ සන්නිවේදන උපකරණ පහසුකම් වලින් සමන්විත කරීම |
| | | අංගසම්පූර්ණ ඉගැන්වීම්, හා මූලික සහ උසස් පර්යේෂණ පරීක්ෂණාගාරයක් ස්ථාපිත කිරීම |
| | | කාර්යමණ්ඩලය සඳහා විශිෂ්ට කාර්ය පරිසරයක් නිර්මාණය කිරීම |
| | ණවීන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පහසුකම් ලබා දීම | පුස්තකාල තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සහ දැනුම මූලික කරගත් කලමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම |
| | | සියළු දේශන ශාලා සහ නේවාසිකාගාර සම්බන්ධ කරමින් විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ පහසුකම් වැඩිදියුණු කැරීම |
| | අගය එකතුකිරීම සඳහා නවීන තාක්ෂන දැණුම භාවිතය පිළිබිඹු කරමින් උපාධි පාඨමාලාවල ප්‍රමිතිය නිරතුරුව පවත්වාගෙන යාම | වෙළඳපොල ඉල්ලුම් අවශ්‍යතාවය පිළිබඳ අභියෝගයට සරිලන පරිදි විෂයමාලා ප්‍රතිශෝධනය කිරීම |
| | ආර්ථික සංවර්ධනයට සහ අගය එකතුකිරීමට අදාළව නව පාඨමාලා හඳුන්වා දීම | ජාතික සම්පත් පදනමට අගය එකතුකිරීම සම්බන්ධයෙන් ඉහළ විභවතා පවතන ක්ෂේත්‍ර හඳුනා ගෙන උපාධි පාඨමාලා හඳුන්වා දීම |
| | ශිෂ්‍යයින්ට තම අධ්‍යාපන පදනම පුළුල්කර ගැනීමට සහ අත්‍යවශ්‍ය කුසලතා වැඩිදියුණුකරගැනීම ට අවකාශ සැලසීම | අගය එකතුකිරීම පිළිබඳ දැනුමට අමතරව අත්‍යවශ්‍ය කුසලතා සහ අංග සම්පූර්ණ පොදු අධ්‍යාපන යක් ලබා දීම |
| | | උපාධි පාඨමාලාවලට අදාළ කාර්මික පුහුණු ලබාදීම |
| | | ඒකපුද්ගල පර්යේෂණ ක්‍රියාකාරකම් |
| | සියලුම ශිෂ්‍යයින්ගේ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය | සම්මන්ත්‍රණ, වැඩමුළු, කාර්මික නායකයින් හමුවීම්, මූලාක ව්‍යාපෘති, කාර්මික ක්ෂෙත්‍රයේ යෙදවීම වැනි අවස්තා සංවිධානය කිරීම |
| | විශ්වවිද්‍යාල පනතේ අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කරන අතරම නව ප්‍රවේශයක් ඔස්සේ විශ්වවිද්‍යාලය සිය දැක්ම කරා මෙහෙය වීම | සියලු පාඨමාලා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ තේමාව අනුව ශක්තිමත් අන්තර් විෂයික සහ ව්‍යවසායකත්ව ලක්ෂණ මත සකස්කිරීම |

| | | |
|---|---|---|
| | අගය එකතු කිරීම අරමුණුකොටගත් පර්යේෂණ සිදුකිරීම | ජාතික සංවර්ධනය අරමුණුකොටගත් පර්යේෂණ ආරම්භ කිරීම සඳහා රජයේ ප්‍රමුකතා, පුද්ගලික ක්ෂේත්‍රයේ අවශ්‍යතා, සහ ශිෂ්‍යයින්ට සහ කාර්යමණ්ඩලයට ඇති සෘජු අභියෝග නිශ්චයකර ගැනීම |
| | සාමූහික ක්ෂේත්‍රයේ පුහුණු අවශ්‍යතා ඉටුකරමින් විශ්වවිද්‍යාලය සාමූහික විශ්වවිද්‍යාලයක් බවට වැඩිදියුණු කිරීම | පුහුණු අවශ්‍යතා හඳුනා ගානීම<br>පුද්ගලික අංශය සමග සමීපව කටයුතු කිරීම |
| | සේවයේ කාර්ය ස්ථම්භ තුන මත පදනම්ව සියළු අධ්‍යයන කාර්යමණ්ඩලය සිය කාර්ය සාධනය දැක්විය යුතු වීම | දේශන පැවැත්වීම, අධීක්ෂණය, පර්යේෂණ සහ සමාජ වගකීම යන කරුණු අනුව අධ්‍යයන කාර්යමණ්ඩලයේ කාර්ය සාධනය ඇගයීම |
| | සෞඛ්‍ය සම්පන්න, එකමුතු, මනාලෙස හික්මුණු, ක්‍රියාශීලී විශ්වවිද්‍යාල ප්‍රජාවක් බිහිකිරීම | භාෂාත්‍රයේම (ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ) කථන හැකියාව වැඩිදියුණු කිරීම සහ සියලු ජනවාර්ගික කණ්ඩායම් අතර අන්තර් ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ සම අවස්තා ලබා දීම |
| | කැපවුනු, ක්‍රියාශීලී, කුසලතා පූර්ණ අධ්‍යයන සහ පරිපාලන කාර්යමණ්ඩලයකින් සමන්විත වීම | සිය කාර්ය සාධනය පවත්වාගෙන යාම මගින් දැක්ම සාක්ශාත් කර ගැනීම සහ අරමුණු ඉටුකරගැනීම අරබයා සියලු කාර්යමණ්ඩලය නායකත්වය ගැනීම සහ අභාප්‍රේරණයෙන් යුතුව කටයුතු කිරීම |
| | | මෙහෙයුම් සාර්තකත්වය සඳහා පරිපාලනයේ නව ක්‍රමෝපා යොදාගැනීම |
| | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට ඇතුළත් වීම සඳහා ශිෂ්‍යයින්ට සුවිශේෂී අවස්තා ලබාදීම දේශීය ප්‍රජාවට සහ ජාතික අවශ්‍යතාවලට අදාළව ව්‍යාප්ති පාඨමාලා පැවැත්වීම සහ සම්පත්වල ඵලදායීතාවය ඉහළ නැංවීම | පහසුකම් සංවර්දනය තුළින් ඉල්ලුම වැඩිවීඇති පාඨමාලාවලට සසුන් ඇතුළත් කිරීම ඉහළ නැංවීම.<br>ජාතික අවශ්‍යතා පවතිනස හ වෙළඳපොලට අදාළ ක්ෂේත්‍රවල නව පාඨමාලා හඳුන්වා දීම .<br>ප්‍රජා අන්තර්ක්‍රියාකාරකම් සහ ආයතනික සබඳතා මගින් දේශීයව අදාළවන ව්‍යාප්ත කළයුතු ක්ෂේත්‍ර හඳුනාගැනීම.<br>ජාත්‍යන්තර සහ භාහිර සම්පත් උපයෝගී කර ගනිමින් ව්‍යාප්ති පාඨමාලා හඳුන්වා දීම සහ දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය හරහා ඒවා ලාභදායී ලෙස පවත්වාගෙන යාම<br>පෞද්ගලික සහ රාජ්‍ය අංශය සමග අන්තර් සබඳතා වර්ධනය කර ගැනීම සහ නොමිලයේ විශේෂඥ උපදෙස් ලබාගැනීමට ඇති අවස්තා හඳුනාගැනීම. |
| | දැණුම බෙදාගැනීම සහ කර්මාන්ත සංවර්ධනයේ දී සහාය වීම | කර්මාන්ත ක්ෂෙත්‍රය හා සබඳතා ගොඩනගා ගැනීම |
| | | ශිෂ්‍යයින් කර්මාන්ත පුහුණුව සඳහා යොමුකිරීම |
| | | විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතාවය හරහා දේශීය කර්මාන්තවලට සහාය වීම |

| | | |
|---|---|---|
| | | |
| | | කාර්මික පිරිස් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම |
| | | වෘත්තීය සුදුසුකම් සහ විශ්ලේශනාත්මක සේවා සඳහා පරීක්ෂණ මධ්‍යස්ථානයක් බවට පත්වීම |
| | ශිෂ්‍යයින් සඳහා රැකියා අවස්තා සහතික වීම | ශිෂ්‍යයින්ට දැණුම සහ කුසලතා ලබාදීම මෙන්ම ව්‍යවසායකයින් සමග මනා සබඳතා ගොඩනගාගැනීමට අවස්තා සැලසීම මගින් තම ප්‍රතිරූපය ගොඩනගාගැනීම සඳහා ශිෂ්‍යයින්ට අවකාශ ලැබීම |
| | කාර්යක්ෂය සහ ඵලදායී සේවාවක් ලබාදීම | විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා භාහිර සේවා ලබාගැනීම |